ශීර්ෂය 103 - රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය

මෙම වාර්තාව කොටස් 02 කින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

2 කොටස - එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

## 1 කොටස

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු

| ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 222 | ශ්‍රී ලංකා යුද හමුදාව |
| 223 | ශ්‍රී ලංකා නාවික හමුදාව |
| 224 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව |
| 225 | පොලිස් දෙපාර්තමේන්තුව |
| 226 | ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව |
| 227 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව |
| 291 | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 320 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව |
| 325 | ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව |

2. ගිණුම්

2.1 විසර්ජන ගිණුම

(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 09 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.244,205,807,595 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.238,572,848,634 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය හා එක් එක් දෙපාර්තමේන්තුවල ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.11,114,396 ත් රු.4,475,173,744 ත් අතර පරාසයක ප්‍රමාණයකින් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.001 ත් සියයට 33.69 ත් අතර පරාසයක පැවැතිණ. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 103 | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 6,968,085,000 | 8,329,590,000 | 6,658,402,799 | 4,164,098,457 | 309,682,201 | 4,165,491,543 |
| 222 | ශ්‍රී ලංකා යුධ හමුදාව | 114,298,350,000 | 3,819,416,000 | 114,286,778,619 | 3,817,081,187 | 11,571,381 | 2,334,813 |
| 223 | ශ්‍රී ලංකා නාවික හමුදාව | 33,208,492,753 | 4,796,860,000 | 33,020,787,087 | 4,742,919,479 | 187,705,666 | 53,940,521 |
| 224 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 21,050,975,000 | 3,649,703,842 | 20,983,577,120 | 3,247,441,757 | 67,397,880 | 402,262,085 |
| 225 | පොලිස් දෙපාර්තමේන්තුව | 35,768,000,000 | 1,067,000,000 | 35,609,094,692 | 1,008,268,879 | 158,905,308 | 58,731,121 |
| 226 | ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව | 608,050,000 | 86,950,000 | 598,655,538 | 85,230,066 | 9,394,462 | 1,719,934 |
| 227 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 204,540,000 | 47,050,000 | 175,212,890 | 42,520,951 | 29,327,110 | 4,529,049 |
| 291 | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 138,010,000 | 770,000,000 | 137,848,105 | 644,766,113 | 161,895 | 125,233,887 |
| 320 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | 9,258,745,000 | 59,700,000 | 9,245,633,317 | 53,942,117 | 13,111,683 | 5,757,883 |
| 325 | ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව | 29,640,000 | 46,650,000 | 26,731,069 | 23,858,392 | 2,908,931 | 22,791,608 |
| | **එකතුව** | **221,532,887,753** | **22,672,919,842** | **220,742,721,236** | **17,830,127,398** | **790,166,517** | **4,842,792,444** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු විසින් පහත සඳහන් පරිදි එකතුව රු.265,650,475 ක් වූ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර ඒවා උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ලැබුණු ප්‍රතිපාදනය | උපයෝජනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය පිළිබඳ නිරීක්ෂණ සංක්ෂිප්තව |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| අධ්‍යාපන අමාත්‍යාංශය | 201,670,475 | 177,697,176 | 23,973,299 | ප්‍රමාණවත් පරිදි අක් මුදල් නොලැබීම සහ බිල්පත් නොලැබීම |
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 30,980,000 | 20,089,898 | 10,890,102 | - එම - |
| බුද්ධශාසන හා ආගමික කටයුතු | | | | වර්ෂය අවසානයේ ප්‍රතිපාදන |

| | | | | |
|---|---|---|---|---|
| අමාත්‍යාංශය | 25,000,000 | - | 25,000,000 | ලැබීම |
| ප්‍රවාහන | | | | බිල්පත් |
| අමාත්‍යාංශය | 8,000,000 | 6,823,658 | 1,176,342 | නොලැබීම |
| එකතුව | 265,650,475 | 204,610,732 | 61,039,743 | |

2.2 ආදායම් ගිණුම්

ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

අමාත්‍යාංශය විසින් 2012 වර්ෂයේ දී ආදායම් සංකේත 04 ක් සඳහා රු.5,893,950,000 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර ආදායම් ලෙස රු.6,457,977,191 ක් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමින් සියයට 109.57 ක ආදායමක් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් ගණන්දීමේ නිලධාරී | ආදායම් සංකේතය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | වැඩියෙන්/ (අඩුවෙන්) එකතුකිරීම | එකතුකළ ආදායම ඇස්තමේන්තුගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | |
| රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් | 10.03.02.05 | 12,250,000 | 11,611,124 | (638,876) | 94.78 |
| ගුවන් හමුදාපති | 20.03.02.16 | 190,000,000 | 164,876,444 | (25,123,556) | 86.78 |
| ආගමන හා විගමන පාලක ජනරාල් | 20.03.02.07 | 5,622,500,000 | 6,197,728,729 | 575,228,729 | 110.23 |
| පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් | 20.03.02.03 | 69,200,000 | 83,760,894 | 14,560,894 | 121.04 |
| **එකතුව** | | **5,893,950,000** | **6,457,977,191** | **564,027,191** | **109.57** |

2.3 අත්තිකාරම් ගිණුම්

2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 08 ක් වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 103 | 10301 | 250,000,000 | 11,190,000 | 113,200,000 | 131,842,760 | 650,000,000 | 373,591,963 |
| 222 | 22201 | 2,135,000,000 | 1,454,431,929 | 1,750,000,000 | 1,769,144,045 | 4,250,000,000 | 2,654,291,082 |
| 223 | 22301 | 590,000,000 | 346,170,525 | 340,000,000 | 394,751,911 | 1,000,000,000 | 550,122,841 |
| 224 | 22401 | 500,000,000 | 334,360,110 | 440,000,000 | 444,527,757 | 1,802,000,000 | 728,967,498 |
| 225 | 22501 | 1,585,000,000 | 1,087,170,194 | 1,000,000,000 | 1,348,558,680 | 5,000,000,000 | 2,774,362,108 |
| 226 | 22601 | 25,000,000 | 22,405,999 | 19,000,000 | 25,815,252 | 154.000,000 | 120,167,682 |
| 227 | 22701 | 25,000,000 | 15,140,122 | 15,000,000 | 20,975,140 | 95,000,000 | 43,052,808 |
| 291 | 29101 | 15,000,000 | 8,205,822 | 8,000,000 | 10,396,023 | 66,900,000 | 39,784,895 |
| 320 | 32001 | 170,000,000 | 159,476.252 | 155,000,000 | 159,581,714 | 150,000,000 | 6,066,563 |

2.3.2 වාණිජ අත්තිකාරම් ගිණුම

අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තුවක් විසින් වාණිජ අත්තිකාරම් ගිණුමක් පවත්වා තිබුණි.

(අ) පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

වාණිජ අත්තිකාරම් ගිණුමක් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | | බැර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 223 | 22302 | 550,000,000 | 531,396,869 | 525,000,000 | 549,221,761 | 550,000,000 | 30,676,133 | - | - |

(ආ) මූල්‍ය ප්‍රතිඵල

වාණිජ අත්තිකාරම් ගිණුමේ මූල්‍ය ප්‍රතිඵල පහත පරිදි විය.

| දෙපාර්තමේන්තුව | විෂය අංකය | අත්තිකාරම් ගිණුම් කටයුත්ත | මූල්‍ය ප්‍රතිඵලය 2012 | | 2011 | |
|---|---|---|---|---|---|---|
| | | | ලාභය කල්පිත ගාස්තු රහිතව | ලාභය කල්පිත ගාස්තු සහිතව | ලාභය කල්පිත ගාස්තු රහිතව | ලාභය කල්පිත ගාස්තු සහිතව |
| | | | රු. | රු. | රු. | රු. |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | 22302 | වෙඩි බෙහෙත් අලෙවි කිරිම | 124.278,407 | 100,441,226 | 123.285,298 | 101,615,133 |

2.4 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම

(අ) අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 07 ක 2012 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුම්වල රු.29,600,861,835 ක් වූ හර ශේෂ පැවතුණි. විස්තර පහත දැක්වේ.

| **අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව** | **2012 දෙසැම්බර් 31 දිනට හර ශේෂය** |
|---|---|
| | **රු.** |
| රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 20,527,173,852 |
| ශ්‍රී ලංකා යුද හමුදාව | 6,728,479,076 |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | 646,711,593 |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 1,639,163,584 |
| පොලිස් දෙපාර්තමේන්තුව | 22,247,327 |
| වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 378,713 |
| සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | 36,518,363 |
| ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව | 189,327 |
| **එකතුව** | **29,600,861,835** |

(ආ) පොදු තැන්පත් ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 09 ක පොදු තැන්පත් ගිණුම් ශේෂවල එකතුව රු.6,783,111,939 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ගිණුම් අංකය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 6000/0000/00/0011/0555/000 | 4,675,280 |
| | 6000/0000/00/0015/0017/000 | 1,015,993,820 |
| ශ්‍රී ලංකා යුද හමුදාව | 6000/0000/00/0015/0103/000 | 198,855,565 |
| | 6000/0000/00/0011/0583/000 | 5,220,208 |
| | 6000/0000/00/0007/0039/000 | 5,000,000,000 |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | 6000/0000/00/0001/0012/000 | 36,500 |
| | 6000/0000/00/0002/0013/000 | 3,974,486 |
| | 6000/0000/00/0015/0104/000 | 216,093,418 |
| | 6000/0000/00/0011/0584/000 | 1,743,436 |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 6000/0000/00/0015/0105/000 | 63,641,018 |
| පොලිස් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0011/0586/000 | 16,154,891 |
| | 6000/0000/00/0015/0106/000 | 167,109,562 |
| ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0107/000 | 1,669,284 |
| | 6000/0000/00/0011/0587/000 | 9,134,495 |
| පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0108/000 | 5,350,482 |
| | 6000/0000/00/0001/0015/000 | 7,908 |
| වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 6000/0000/00/0003/0024/000 | 9,342,589 |
| | 6000/0000/00/0003/0146/000 | 24,422,559 |
| සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0166/000 | 39,598,023 |
| ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0171/000 | 88,415 |
| එකතුව | | 6,783,111,939 |

## 2 කොටස

## එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

### 1. ශීර්ෂය 103 - රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

### 1.1 විගණන විෂය පථය

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ඔක්තෝබර් 28 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 1.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඊ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.10 දක්වා වූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ගිණුම් ඉදිරිපත් කිරීම**

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2013 මාර්තු 31 දින වන විට විගණනයට ඉදිරිපත් කළ යුතු ජාතික ආරක්ෂක අරමුදල ගිණුම මාස 03 ක ප්‍රමාදයකින් පසුව 2013 ජුනි 26 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණි.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ |
| පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් වන ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**(ඇ) අග්‍රිම ගිණුම**

හෝටල් කර්මාන්තයේ සංවර්ධනය සඳහා විදේශ සමාගම් දෙකකට ලබා දී තිබුණු රජයේ ඉඩමක් වෙනුවෙන් ලැබී තිබුණු රු.19,817,306,000 ක මුදල, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලට බැර වන පරිදි භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකර, අමාත්‍යාංශයේ අග්‍රිම ගිණුමේ රඳවා ගෙන තිබුණි. එම මුදල අමාත්‍යාංශය විසින් ආයෝජනය කර 2011 වර්ෂයේදී රු.800,031,971 ක්ද, 2012 වර්ෂයේදී රු.2,102,216,528 ක්ද වශයෙන් එකතුව රු.2,902,248,499 ක පොලියක් ලබා ගෙන තිබුණි. අකුරේගොඩ අමාත්‍යාංශ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2011 හා 2012 වර්ෂවල පාර්ලිමේන්තුව විසින් පිළිවෙලින් රු.100,000,000 ක් හා රු.700,000,000 ක් වශයෙන් රු.800,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. එම ප්‍රතිපාදන පිළිවෙලින් රු.236,525,195 කින් හා රු.1,155,855,452 කින් ඉක්මවා රු.2,192,380,647 ක් ඉඩම විකුණා ලද මුදලින් උපයෝජනය කර තිබුණි. ඒ අනුව 2012 දෙසැම්බර් 31 දින වන විට ඉඩම විකිණීම හා එම මුදල් ආයෝජනයෙන් ලද පොළිය සහ 2011 හා 2012 වර්ෂවලදී සිදු කළ උපයෝජනයන් අඩුකළ පසු ශේෂය රු.20,527,173,852 ක් වී තිබුණි. 2012 නොවැම්බර් 20 දිනැති අංක 05/2012 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයට පටහැනිව 2012 දෙසැම්බර් 31 දිනට වූ රු.20,527,173,852 ක් වූ අග්‍රිම ශේෂය භාණ්ඩාගාරයට පියවා නොතිබුණි. මෙම අග්‍රිම ශේෂය 2013 වර්ෂයේ ගෙවීම් සඳහා යොදා ගැනිමට, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස්වලට පටහැනිව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරයෙකු විසින් අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී විසින් පිළියෙල කර මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරන ලද මාරු කිරීමේ පත්‍රයට 2013 පෙබරවාරි 01 දින අවසර ලබා දී තිබුණි. එමෙන්ම අමාත්‍යාංශය විසින් අකුරේගොඩ ඉදිකරනු ලබන අමාත්‍යාංශ ගොඩනැගිල්ල වෙනුවෙන් 2011 හා 2012 වර්ෂවල පාර්ලිමේන්තුව අනුමත කළ ප්‍රතිපාදනය ඉක්මවා පිළිවෙලින් රු.336,525,195 ක් හා රු.1,855,855,452 ක් උපයෝජනය කර තිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 02 ක් ඉක්මවූ රු.493,380 ක් වූ තැන්පතු 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඉ) ආදායම් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිරිපත් කළ ආදායම් ගිණුමට අනුව රු.1,166,400 ක් වූ ආදායම් හිඟ හිට තිබුණු අතර එම හිඟ හිටි ආදායම වර්ෂ 1 සිට වර්ෂ 3 දක්වා කාල පරාසයකට අදාල විය. එම හිඟ හිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) 2002 ජුලි 17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ (4)(ආ) ඡේදය අනුව සෑම ආදායම් ගණන්දීමේ නිලධාරියෙකු විසින්ම හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර හිඟ ආදායම් තව දුරටත් එකතුවීම වැලැක්වීම සඳහා නිසි අවධානයක් යොමු කළ යුතුය. එහෙත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.1,166,400 ක හිඟහිටි ආදායමක් ආදායම් ගිණුමේ දක්වා තිබුණි.

(iii) එක් එක් වර්ෂයේ ශුද්ධ ආදායම අමාත්‍යාංශයේ පොත්වල වාර්තා කිරිමේදී එක් එක් වර්ෂයට අදාල ආදායම සහ ඊට පෙර වර්ෂවල හිඟ ආදායමින් රැස්කරන ලද ආදායම වෙන වෙනම හඳුනා ගත හැකිවන පරිදි වාර්තා නොකිරීම හේතුකොටගෙන වාර්ෂික ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය හා හිඟ ආදායම් රැස් කිරිමේ ප්‍රගතිය පිළිබඳ නිවැරදි සමාලෝචනයක් කිරීමට විගණනයට නොහැකි විය.

**(ඊ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 10301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.23,069,180 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) අමාත්‍යාංශයේ පොත් අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් අනුව වූ ශේෂයට සමාන බව පෙන්නුම් කිරීම සඳහා අමාත්‍යාංශයේ සේවය නොකරන නිලධාරීන් 4 දෙනෙකුගේ නම්

කේවල ශේෂ ලැයිස්තුවට සාවද්‍ය ලෙස ඇතුළත් කර රු.476,168 කින් දෙපාර්තමේන්තු පොත් අනුව දැක්වෙන ණය ශේෂය වැඩියෙන් දක්වා තිබුණි.

(iii) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය පරිදි නිලධාරියෙකු ස්ථාන මාරුවීම් ලබා මාස 03 ක් ගත වීමට පෙර මාසික ගිණුම් සාරාංශ මඟින් එම නිලධාරියාගේ ණය ශේෂ පියවා ගත යුතු වුවද, 2005 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ස්ථානමාරු වී ගිය නිලධාරින් 24 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.1,766,941 ක ණය ශේෂ එසේ පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) 2012 දෙසැම්බර් 31 දිනට චලනය නොවන එකතුව රු.16,820,782 ක හිඟ ණය ශේෂ 1088 ක් පැවතුණි.

(v) ස්ථාන මාරුවීම, මියයාම හා විශ්‍රාමයාම, සේවයෙන් පහකිරීම, සේවය අතහැරයාම සහ වෙනත් කරුණු නිසා අයකරගැනීමට නොහැකිවූ වර්ෂ 5 ක් ඉක්මවන නිලධාරින් 803 දෙනෙකුගේ හිඟහිටි රු.13,618,706 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 1.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.4.1 සංයුක්ත සැලැස්ම

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේ දී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

ඉහත 1.4.1 ඡේදයේ සඳහන් පරිදි රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.4.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

ඉහත 1.4.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය

මුදල් චක්‍රලේඛ ප්‍රකාර අමාත්‍යාංශය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2013 නොවැම්බර් 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**1.4.4 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**1.5 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථාවක් විග්‍රහකර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මුදල් රෙගුලාසි 104(1) | 115,000 | ප්‍රතිමූර්තිකරණ යන්ත්‍රය සඳහා භාවිතා කළ සී.පී.යු යන්ත්‍රය අස්ථානගත වී ඇති බව 2012 සැප්තැම්බර් මාසයේදී අනාවරණය වී තිබුණ ද, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම සඳහා පරීක්ෂණ මණ්ඩල පත්කිරීම 2013 ජනවාරි මාසය දක්වා ප්‍රමාද කර තිබුණි. |

| | | |
|---|---|---|
| | | පාඩුවක් හෝ අලාභයක් හෝ සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චිත වශයෙන් දැන ගැනීමටත් එයට වගකිව යුත්තන් නිශ්චය කිරීමටත් පරීක්ෂණ ආරම්භ කළ යුතු වුවද, අමාත්‍යාංශයට අයත් වාහන 02 ක් අනතුරට පත්වී මාස 7 ක් ඉක්මවූ පසු පරීක්ෂණ මණ්ඩල පත්කර අදාල වාර්තා ලබාදී තිබුණු බව නිරීක්ෂණය විය. |
| (ii) මුදල් රෙගුලාසි 218(2) | 843,924 | විධිවිධාන සළසා ඇති අවස්ථාවලදී හැර අන් සෑම අවස්ථාවකදීම මුදල් වර්ෂය ඇතුළත හිමිකම්පෑම් එම වර්ෂය ඇතුළතදීම ගෙවා බේරුම් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් හිඟ විදුලි බිල්පත් ගෙවීමේදී ලංකා විදුලිබල මණ්ඩලයට රු.843,924 ක පොළියක් සමාලෝචිත වර්ෂය තුළ දී ගෙවා තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 756, 757 හා 1647(ආ) | | 2012 වර්ෂයේ හා ඊට පෙර වර්ෂවලදී අමාත්‍යාංශයේ වාහන සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ පවත්වා නොතිබුණි. |

**1.6 විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් නොවීම**

ආරක්ෂක සේවා විද්‍යාලයට අවශ්‍ය පාසල් ලී බඩු සකස් කිරීම සඳහා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2011 වර්ෂයේදී රු.3,291,209 ක් වැයකර මිලදී ගත් දැව 6 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව වෙත ලබා දී තිබුණි. එම රෙජිමේන්තුව විසින් සකස් කළ ලී බඩු පිළිබඳ විස්තර සහ එම ලී බඩු විද්‍යාලය වෙත භාරදීම් පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොකිරිම නිසා මිල දී ගත් දැව අදාල කාර්යයට යොදවා තිබුණු බව තහවුරු කර ගැනීමට නොහැකි විය.

## 1.7 අවිධිමත් ගනුදෙනු

**ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැර වීම.**

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යාලය හා ත්‍රිවිධ හමුදා මූලස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශවලට පටහැනිව ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ තීරණ ලබාගැනීමට පෙර ව්‍යාපෘතිය විසින් අවස්ථා 03 කදී වටිනාකම රු.44,371,865 ක් වූ භාණ්ඩ හා සේවා සපයාගෙන තිබුණි.

(ආ) මිල සැඳහුම් ක්‍රමය යටතේ අවස්ථා 09 කදී රු.22,608,182 ක භාණ්ඩ මිල දී ගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව සැපයුම්කරුවන්ට ලංසු ඉදිරිපත් කිරීම සඳහා අවම වශයෙන් දින 07 ක් ලබාදිය යුතු වුවත් එසේ ලබා දී තිබුණේ දින 03 සිට දින 06 දක්වා කාල පරාසයකි. මේ අනුව සැපයුම්කරුවන්ට ලංසු පිළියෙල කිරීම සඳහා සාධාරණ කාලයක් ලබා නොදීම හේතුවෙන් තරඟකාරී මිල ගණන් ලබාගැනීමට තිබෙන ඉඩකඩ සීමාවී තිබුණි.

(ඇ) ජාතික තරඟකාරී මිල ගණන් කැඳවීමේ ක්‍රමය යටතේ පුවත්පත් දැන්වීම් ප්‍රසිද්ධ කර ලංසු කැඳවා අවස්ථා 05 කදී රු.195,207,320 ක් වූ භාණ්ඩ මිල දී ගෙන තිබුණි. ඒ සඳහා දින 09 සිට 11 දක්වා අවම කාලයක් පමණක් ලබා දී තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු ඉදිරිපත් කිරීමට දින 21 ක අවම කාලයක් සැපයුම්කරුවන්ට ලබාදිය යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ඈ) ජාතික තරඟකාරී මිල ගණන් කැඳවීමේ ක්‍රමය යටතේ අවස්ථා 05කදී භාණ්ඩ හා සේවා සැපයීම සඳහා ලංසු ලේඛන ලබාගැනීමට රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.1.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු කැඳවීමේ අවසාන දිනට පෙර වූ දිනය දක්වාම ලංසු ලේඛන ලබාගැනීමට ලංසුකරුවන්ට ඉඩ සළසා දිය යුතු වුවද ඒ සඳහා දින 04 ක පමණ කාලයක් ලබා දී තිබුණි.

## 1.8 වංචනික ස්වරූපයේ ගනුදෙනු

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ නවීකරණ කටයුතු සඳහා 2011 අප්‍රේල් 08 දින එකක් රු.14,800 බැගින් වූ ඩෝ හැඬල් 68 ක් රු.1,006,400 කට මිල දී ගෙන තිබුණි. එම භාණ්ඩ අදාල අවශ්‍යතාවය සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව අමාත්‍යාංශ ගබඩාවේ රඳවා ගැනීම සම්බන්ධයෙන් නිකුත් කළ විගණන විමසුමෙන් පසු එම ඩෝ හැඬල් තොගය 2012 ජුනි 18 දින පරිත්‍යාග වශයෙන් ආරක්ෂක සේවා විද්‍යාලයේ ඉදිකිරීමේ කටයුතු සඳහා ලබා දී තිබුණි. 2013 ජනවාරි 18 දින ආරක්ෂක සේවා විද්‍යාලයේ සිදුකරන ලද විගණන පරීක්ෂණයේ දී පරිත්‍යාග ලෙස ලබා දී තිබුණු ඉහත ඩෝ හැඬල් තොගය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන 6 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ ගබඩාවේ ගබඩා කර තිබුණි. එම ඩෝ හැඬල් කිසිදු දොරකට සවිකළ නොහැකි බව භෞතික පරීක්ෂණයේ දී නිරීක්ෂණය විය. එම වර්ගයේ ඩෝ හැඬල් 2013 පෙබරවාරි 06 දින වන විට වෙළඳපලේ පවතින මිල අනුව ඩෝ හැඬල් 1 ක් රු.2,500 බැගින් සියයට 10 ක වට්ටමක් ද සහිතව මිලට ගත හැකි බව විගණනයට නිරීක්ෂණය විය.

ඒ අනුව ඩෝ හැඬල් මිල දී ගැනීමේ දී එක් ඩෝ හැඬලයක් රු.12,550 බැගින් ඩෝ හැඬල් 68 ක් සඳහා රු.853,400 ක පමණ මුදලක් වැඩිපුර ගෙවා ඇති බවත් අමාත්‍යාංශය වැයකර තිබුණු රු.1,006,400 ක් වූ මුළු මුදලම ඒකාබද්ධ අරමුදලට සිදු කරන ලද අලාභයක් බැවින් එම අලාභය ඊට වගකිව යුතු නිලධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 1.9 පාඩු හා හානි

සාමාන්‍ය වෙළඳපල මිල රු.2,200,000 ක් පමණ වූ කැබ් රථයක් රු.800,000 ක පමණ අඩු මුදලකට රක්ෂණය කර තිබීම හේතුවෙන් 2011 අගෝස්තු 16 දින මෙම රථයට සිදු වූ අනතුරකින් පසු අලුත්වැඩියාව සඳහා වැය වූ රු.192,280 ක මුදලින් රක්ෂණ ආයතනය විසින් රක්ෂණ වන්දි ලෙස රු.65,396 ක් ගෙවා තිබුණි. ඉතිරි මුදලින් සියයට 10 ක් රියදුරුගෙන් අයකර ගෙන රු.114,195 ක්වූ අලාභය කපාහැරීම සඳහා පරීක්ෂණ මණ්ඩලය නිර්දේශ කර තිබුණි. ඒ අනුව සාමාන්‍ය වෙළඳපල මිලට වාහනය රක්ෂණය නොකිරීම හේතුවෙන් සම්පූර්ණ අලාභය රක්ෂණ වන්දි ලෙස ලබාගැනීමට තිබුණු අවස්ථාව අහිමිවී තිබුණි.

## 1.10 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ආරක්ෂක සේවා විද්‍යාලයේ ප්‍රයෝජනය සඳහා 2011 වර්ෂයේ දී මිල දී ගෙන තිබුණු පිරිවැය රු.5,832,984 ක් වූ ලී බඩු හා කාර්යාල උපකරණ වර්ෂ 02 කට ආසන්න කාලයක් භාවිතා කිරිමකින් තොරව ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණි. එම ලී බඩු හා කාර්යාල උපකරණ වලින් රු.1,369,515 ක තොග ගබඩාවට ලද දිනයේ සිට 2013 ජනවාරි 15 දින වන විටත් විද්‍යාලයේ කිසිම කටයුත්තකට භාවිතා කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් රු.189,000 ක් වූ හයි ස්ටෝරේජ් කැබිනට් 03 ක් 2012 ජුනි 01 දින ආරක්ෂක සේවා විද්‍යාලයේ ගබඩාව වෙත භාර දී තිබුණි. එම කැබිනට් 03 හි යතුරු තහඩු ගැලවී ඉවත්වී තිබුණු බව 2013 ජනවාරි 15 දින සිදුකළ භෞතික පරීක්ෂණයේදී නිරීක්ෂණය වූ අතර ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් අමාත්‍යාංශය විසින් ගෙන නොතිබුණි.

(ඇ) ආරක්ෂක සේවා විද්‍යාලයේ තුන්වන පරිශ්‍රය සඳහා යතුරු දැමිය හැකි ලාච්චු 04 කින් යුත් වානේ කබඩ් 120 ක් එකක් රු.25,200 බැගින් රු.3,024,000 ක් වැය කර මිලදී ගැනීම සඳහා තෝරාගත් ආයතනයක් වෙත ඇණවුම් කර තිබුණි. එම පිරිවිතරයන්ට පටහැනිව එම ආයතනය විසින් එකක් ලාච්චු 4 කින් යුත් වානේ කබඩ් 03 ක් එකිනෙකට සම්බන්ධ කර සැකසූ වානේ කබඩ් 40 ක් සපයා තිබුණි. ඒ අනුව එම භාණ්ඩ ප්‍රතික්ෂේප කළ යුතු වුවද එම භාණ්ඩ භාරගෙන ඇණවුමේ සඳහන් මුදල ගෙවා තිබුණි. එම භාණ්ඩ භාරගැනීමට සහ මුදල් ගෙවීමට කටයුතු කළ නිලධාරීන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොතිබුණි.

(ඈ) රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ නාගරික සංවර්ධන අංශය විසින් පවත්වා තිබුණු ඉන්වෙන්ට්‍රි ලේඛන බොහෝමයක් නියමිත විධිවිධානයන්ට බැහැරව ටිපෙක්ස් කර වෙනස් කර තිබුණු අතර ඇතැම් ඉන්වෙන්ට්‍රි භාණ්ඩ වල ලැබීම්වලට වඩා නිකුත් කිරීම් වැඩි ප්‍රමාණයක් දක්වා තිබුණි. විනාශ කරන ලද භාණ්ඩ අයිතම 57 ක් හා වෙන්දේසියේ විකුණන ලද භාණ්ඩ අයිතම 64 ක් ඉන්වෙන්ට්‍රි ලේඛනවලින් ඉවත් කර ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කළ යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ඉ) රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ 2012 මූලා බලතල පැවරීම යටතේ ජාතික ශිෂ්‍යභට බලකායේ අධ්‍යක්ෂට ගෙවීම් අනුමත කිරිම සඳහා ඉඩ දී

තිබුණු රු.75,000 ක සීමාව ඉක්මවීම වැලැක්වීම සඳහා එකම වර්ගයේ භාණ්ඩ ආසන්න දිනයන්වලදී කොටස් වශයෙන් මිල දී ගෙන බිල්පත් කිහිපයකින් ගෙවීම් කර තිබුණි. මුළු වටිනාකම රු.1,090,742 ක් වූ නිදන මළු, ටයර් හා ටියුබ් , කල්දේරම් සහ පිඟන් ගඩොල් මිල දී ගෙන තිබුණු එවැනි අවස්ථා 04 ක් නියැදි විගණන පරීක්ෂණයේ දී නිරීක්ෂණය විය. මෙලෙස එකම භාණ්ඩය කොටස් වශයෙන් මිල දී ගැනීම නිසා ලබාගත හැකිව තිබුණු වෙළඳ වට්ටම් අහිමිවී තිබුණු බවත් එකම භාණ්ඩය මිලට ගැනීම සඳහා නිතර නිතර මිල ගණන් කැඳවීමට සහ අදාල ලිපි කටයුතු සඳහා අනවශ්‍ය පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

(ඊ) රාජ්‍ය ආරක්ෂක හා ත්‍රිවිධ හමුදා මූලස්ථාන ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ලබාගෙන තිබුණු විදුලි සැපයුම් 2 ක් වෙනුවෙන් 2012 පෙබරවාරි සිට අප්‍රේල් දක්වා කාලයට අදාල බිල්පත් 4 ක් නියමිත දිනට නොගෙවීම නිසා රු.21,290 ක පොළී මුදලක් ලංකා විදුලි බල මණ්ඩලයට ගෙවා තිබුණි.

(උ) අමාත්‍යාංශයේ සේවක පිරිවැටුම පරීක්ෂා කිරීමේ දී අමාත්‍යාංශය වෙත පත්වීම් ලබාගෙන සහ ස්ථාන මාරුවීම් ලබාගෙන පැමිණි සේවකයන් විශාල ප්‍රමාණයක් දීර්ඝ කාලයක් තිස්සේ අමාත්‍යාංශය තුළ රැඳී සිටින බව විගණනයට නිරීක්ෂණය විය. රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල අවුරුදු 5 ක සේවා කාලයක් සම්පූර්ණ කරන නිලධාරීන් අමාත්‍යාංශ අතර මාරු කිරීමේ ක්‍රමවේදයක් රාජ්‍ය පරිපාලනය තුළ ක්‍රියාත්මක වුවද, අවුරුදු 30, 20, 10 සහ 7 ට වැඩි සේවා කාලයක් සහිත රාජ්‍ය සේවකයන් රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය තුළ දිගින් දිගටම සේවයේ යොදවා තිබුණි.

## 2. ශීර්ෂය 222 - ශ්‍රී ලංකා යුද හමුදාව

### 2.1 විගණන විෂය පථය

ශ්‍රී ලංකා යුද හමුදාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 සැප්තැම්බර් 05 දින යුද හමුදාධිපති වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ , අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ

ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ශ්‍රී ලංකා යුද හමුදාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.8 දක්වා වූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අග්‍රිම ගිණුම

2013 අප්‍රේල් 30 දින වනවිට පියවා නොතිබුණු 2012 දෙසැම්බර් 31 දිනට වූ අග්‍රිම ශේෂ එකතුව රු.6,527,029,579 ක් වී තිබුණි.

### (ආ) පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අබලි ලෝහමය ද්‍රව්‍ය විකිණීමෙන් ලද රු.40,404,136 ක් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ii) සරසවි සිසුන්ගේ නායකත්ව පුහුණුව සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබුණු මුදල් වලින් ඉතිරි වූ රු.33,625,870 ක් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 22201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.379,418,157 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 2.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 2.4.1 සංයුක්ත සැලැස්ම

සියලුම අමාත්‍යාංශ ලේකම්රුවන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් ශ්‍රී ලංකා යුද හමුදාව විසින් වර්ෂය ආරම්භයේ දී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

එකතුව රු.70,004,202 ක් වටිනා වාහන 44 ක් නිෂ්ක්‍රීයව පවතින බව නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය විය.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

හමුදාව විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.17,753,718,642 ක් වූ අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි. එම ශේෂයන් පියවා දැමීමේ තත්ත්වය අසතුටුදායක විය.

## 2.6 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) ව්‍යවස්ථාපිත විධිවිධාන | | |
| (i) 1981 අංක 26 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත | 816,365 | සේවකයාගෙන් අයකරගනු ලබන අර්ථසාධක අරමුදල් දායකය සේවක අර්ථසාධක අරමුදල වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මුදල් රෙගුලාසි 94 | 17,745,375,888 | වැය විෂයයන් 42 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු වූ ඉතිරිය ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 115 | 2,795,031 | මුදල් වර්ෂයක් ඇතුළත ඉදිරිපත් කරන හිමිකම් එම වර්ෂය තුළදීම පියවිය යුතු වුවත්, 1994 හා 1999 වර්ෂවලට අදාල මිල දී ගැනීම් 2012 වසරේ දීද පියවා තිබුණත්, ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 137(5) | 1,914,595 | සපයා තිබුණු භාණ්ඩ පරීක්ෂා කර නිවැරදි ලෙස භාරගත් බවට සනාථ කර නොගෙන ඒවා සඳහා ගෙවීම් කර තිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 429 | - | මුදල් වර්ෂයක් අවසානයේ දී ගිණුම් පියවා එම ශේෂ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට පියවිය යුතු වුවත්, බැංකු ගිණුම් 02 කට අදාල ශ්‍රී ලංකා රු.6,361,050,637 ක් හා එක්සත් ජනපද ඩොලර් 14,144,107 ක මුදල් ශේෂ එසේ පියවා නොතිබුණි. |

(ඇ) ජාතික අයවැය චක්‍රලේඛ

| | | |
|---|---|---|
| 2012 පෙබරවාරි 16 දිනැති අංක 156 දරන චක්‍රලේඛයේ 6 ඡේදය | 432,578 | රාජ්‍ය අරමුදල්වලින් සංග්‍රහ වියදම් දැරීමේදී එම වියදම් සෘජුවම දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අදාළ විය යුතු වුවත්, නිලධාරීන්ගේ හා විනෝදාත්මක කාර්යයන් වෙනුවෙන් එම වියදම් සිදු කර තිබුණි. |

## 2.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

හමුදාව විසින් කර ඇති සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී එසේ අනාවරණය වූ ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර ) පුස්තකාලය සඳහා රෙජිමේන්තු ආයතන සභාපති ගිණුමෙන් පොත් මිල දී ගත් බව සඳහන් කරමින් ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර රු.915,095 ක මුදලක් 2012 පෙබරවාරි 03 දින රාජ්‍ය අරමුදල්වලින් ප්‍රතිපූර්ණය කරවා ගෙන තිබුණි.

(ආ) මින්නේරිය කාලතුවක්කු පුහුණු පාසල විසින් පොත් මිල දී ගැනීම සඳහා 2011 දෙසැම්බර් 28 දින පෞද්ගලික ආයතනයකට රු.999,500 ක් ගෙවා තිබුණ ද, එදින වන විට පොත් කිසිවක් පුස්තකාලයට ලැබී නොතිබුණි.

(ඇ) මෝදර රොක්හවුස් කඳවුරේ පස්මහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් වෙනුවෙන් මිල දී ගත් පෙරනිමි කොන්ක්‍රීට්වලට වෙනත් පුද්ගලික ආයතනයක චෙක්පතකින් රු.2,278,972 ක් ගෙවා තිබුණි.

**2.8 අවිධිමත් ගනුදෙනු**

-------------------

හමුදාව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) අධිකාරි බලය නොමැති වූ ගනුදෙනු**

---------------------------------------

ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) පුස්තකාලයට පොත් මිල දී ගැනීමේදී ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරා ගත් ආයතනවලින් මිල දී නොගෙන 2012 පෙබරවාරි 16 දින වෙනත් ආයතනයකින් රු.559,933 ක් වටිනා පොත් මිල දී ගෙන තිබුණි.

**(ආ) පාඩු හා හානි**

----------------

නියැදි විගණන පරීක්ෂණවල දී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(i) මොරටුව මහ නගර සභාවට ගෙවිය යුතු වරිපනම් ප්‍රමාද වීම මත රු.474,845 ක වරෙන්තු ගාස්තු ගෙවා තිබුණි.

(ii) වසර 10 කට වඩා පැරණි සිද්ධි 104 කට අදාල රු.මිලියන 1,187.9 ක හානි හා පාඩු සම්බන්ධයෙන් සොයා බලා අදාල පුද්ගලයින්ගෙන් අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) අනාර්ථික ගනුදෙනු**

----------------------

ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) පුස්තකාලයට පොත් මිල දී ගැනීමේ දී නියමිත රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකිරීම නිසා ලබාගත හැකිව තිබූ සියයට 12 හා සියයට 10 ක වට්ටම් වාසි අහිමි වී තිබුණි.

## 3 ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාව

### 3.1 විගණන විෂය පථය

ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ඔක්තෝබර් 31 දින නාවික හමුදාපති වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 3.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 3.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ශ්‍රී ලංකා නාවික හමුදාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 3.4 සිට 3.12 දක්වා වූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ගිණුම් ඉදිරිපත් කිරීම**

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් 2013 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂය අංකය | ගිණුමේ නම | ඉදිරිපත් කළ දිනය | ප්‍රමාද කාලය |
|---|---|---|---|
| | | | දින. |
| 22301 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශනය | 2013 අප්‍රේල් 29 | 29 |
| 22302 | ගබඩා අත්තිකාරම් ගිණුම | 2013 අප්‍රේල් 29 | 29 |

**(ආ) අග්‍රිම ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 අප්‍රේල් 30 දින වන විට ශ්‍රී ලංකා නාවික හමුදාව පියවා නොතිබුණු අග්‍රිම ශේෂය රු.646,711,593 ක් වී තිබුණි. ඉන් රු.618,207,963 ක් වූ ශේෂයක් 2010 වර්ෂයේ සිට පැවත එමින් තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්ය නිම කළ වහාම ලබා ගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, කාර්ය නිම වී මාස 03 සිට මාස 09 දක්වා වූ කාල ප්‍රමාදයන්ගෙන් පසුව අවස්ථා 08 ක දී රු.540,000 ක්වූ අතුරු අග්‍රිම නිරවුල් කර තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 22301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.14,635,704 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

### 3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

#### 3.4.1 සංයුක්ත සැලැස්ම

සියලුම අමාත්‍යාංශ ලේකම්රුවන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් වර්ෂය ආරම්භයේ දී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

#### 3.4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

ඉහත 3.4.1 ඡේදයේ සඳහන් පරිදි රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

#### 3.4.3 වාර්ෂික කාර්යසාධන වාර්තා

ඉහත 3.4.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2013 ජූලි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

#### 3.4.4 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

#### 3.4.5 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරිම

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජ්/09/01 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර කාර්තුවකට එක බැගින් රැස්වීම් පැවැත්විය යුතු වුවත්, 2012 වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර දෙකක් පමණක් පවත්වා තිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

**ලැබිය යුතු ශේෂ**

බාහිර පාර්ශවයන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු වර්ෂ 01 ට වැඩි වර්ෂ 05 ට අඩු ශේෂවල වටිනාකම රු.9,813,686 ක් වූ අතර එම ශේෂ අයකර ගැනීම දුර්වල තත්ත්වයක පැවතුණි. තව ද ඇණවුම් කරන ලද සියළුම භාණ්ඩ/ද්‍රව්‍ය සපයා අවසන් කිරීමට ප්‍රථම පූර්ව ගෙවීම් ප්‍රේෂණපත් මඟින් සැපයුම්කරුවන් වෙත මුදල් ගෙවීම හේතු කොට ගෙන වැඩිපුර ගෙවන ලද මුදල් ආපසු අයකර ගැනීම සඳහා නඩු පැවරීමට ශ්‍රී ලංකා නාවික හමුදාවට සිදු වී තිබුණි.

**3.6 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවන් විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මුදල් රෙගුලාසි 210(1) | 420,535 | වට්ටමක් ලබාගත හැකි සෑම අවස්ථාවකදීම එම වට්ටම ලබාගත හැකිවන පරිදි ජල බිල්පත් ගෙවා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 257 | 3,394,185 | අවස්ථා 08 ක දී භාණ්ඩ කිසිවක් සැපයීමට පෙර සැපයුම්කරුවන්ට මුදල් ගෙවා තිබුණි. |

**3.7 විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් නොවීම**

2011 වර්ෂයට අදාල එකතුව රු.17,585,308 ක් වූ ගෙවීම් වවුචර් 08 ක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

දැයට කිරුළ ප්‍රදර්ශනයේ ඉදිකිරීම් සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමට මුදල් රෙගුලාසි 137(5) ට පටහැනිව රු.1,980,000 ක් සැපයුම්කරුට ගෙවා තිබුණු අතර භාණ්ඩ සැපයීමකින් තොරව දින 6 කට පසු සැපයුම්කරු එම මුදල ශ්‍රී ලංකා නාවික හමුදාවට ආපසු ගෙවා තිබුණි. ඒ අනුව රජයේ මුදල් අයථා පරිදි පරිහරණය කිරීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව සැපයුම්කරුට ඉඩ ලබා දී තිබුණි.

**3.9 අවිධිමත් ගනුදෙනු**

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කාලසටහනක් රහිතව භාණ්ඩ මිලට ගැනීමට කටයුතු කිරීම සහ භාණ්ඩවල පිරිවිතරයන් නිවැරදිව හඳුනා නොගැනීම හේතුකොටගෙන වැලිසර නාවික රෝහලට ප්‍රයිවසි කර්ටේන් (Privacy Curtain) මීටර් 1316 ක් මීටරයක් රු.10,500 බැගින් රු.13,818,000 කට මිලට ගැනීමට තිබුණු අවස්ථාව අභිබවා මීටරයක් රු.12,500 බැගින් රු.16,450,000 කට මිලට ගැනීමට සිදුවීම හේතුකොටගෙන රු.2,632,000 ක අලාභයක් රජයට සිදුවී තිබුණි.

(ii) ශ්‍රී ලංකා නාවික හමුදාවට සෙරමික් ප්ලේට් 350 ක් මිලදී ගැනීමේ දී තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය ප්‍රකාරව අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණු ගනුදෙනුකරුවන්ගෙන් මිලදී ගැනීමට කටයුතු නොකර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය පරිදි ඊට වැඩි මිලක් ඉදිරිපත් කර තිබුණු

සැපයුම්කරුගෙන් මිලදී ගැනීම හේතුකොට ගෙන රජයට රු.57,750 ක පාඩුවක් සිදුවී තිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 (ආ) iii මාර්ගෝපදේශය ප්‍රකාරව වලංගු කාලය තුළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු ලැබුවහොත් ලංසුකරු විසින් කොන්ත්‍රාත්තුව අත්සන් කරන බවට සහතික වීම පිණිස ලංසු සුරක්ෂණ ලබාගත යුතු වුවද, රු.9,271,475 ක වටිනාකමින් යුත් වායුසමීකරණ යන්ත්‍ර මිලදී ගැනීමේදී ලංසු සුරක්ෂණ ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු ඉදිරිපත් කරන ලද එකම සැපයුම්කරුගෙන් භාණ්ඩ මිලට ගැනීමට තීරණය කරන විට එම භාණ්ඩයේ වෙළඳපල මිල ගණන් පරීක්ෂා කර ඉදිරිපත් කර ඇති ලංසු මිල අධික නම් ලංසු මිල අඩුකිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අදාල සැපයුම්කරු සමග සාකච්ඡා කළ යුතු වුවද රු.88,590 ක් වටිනා DVD ඩුප්ලිකේටරයක් මිලදී ගැනීමේදී එපරිදි කටයුතු කර නොතිබුණි.

(v) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.11 මාර්ගෝපදේශය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පිළියෙල කළ යුතු ලංසු ඇගයීම් වාර්තාව පිළියෙල කිරීමකින් තොරව රු.635,459 ක භාණ්ඩ මිල දී ගෙන තිබුණි.

**(ආ) අධිකාරි බලය නොමැති වූ ගනුදෙනු**

---------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අධිකාර බලය නොළත් ගනුදෙනු පහත දැක්වේ.

(i) 2011 ජුලි 11 දින සිට 2012 ජුනි 30 දින දක්වා වූ කාලය තුළ ප්‍රදීපාගාර අවන්හල පවත්වාගෙන යාමෙන් උපයන ලද රු.73,397,600 ක ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණු අතර එම ආදායම් ඉපයීම සඳහා වියදම් වශයෙන් රු.67,663,065 ක් ඒකාබද්ධ අරමුදලින් වැය කර තිබුණි.

(ii) 2009 පෙබරවාරි 3 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සහ රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හා ආයතන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නියමයන්ට අනුව බාහිර පාර්ශවයන්ට සපයන සේවා වෙනුවෙන් උපයනු

ලබන සියළුම ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු බව අවධාරණය කර තිබුණ ද, ශ්‍රී ලංකා නාවික හමුදාව ඒ අනුව කටයුතු නොකර සියළුම ආදායම් සුභසාධන අරමුදලට බැර කර ගෙන අධිකාර බලයකින් තොරව වැයකර තිබුණි.

(iii) ප්‍රසම්පාදන උපදෙස් පත්‍රිකාව අනුව රු.මිලියන 2 ට වැඩි වටිනාකමින් යුත් සැපයුම් ලබා ගැනීමේදී සැපයුම්කරු සමඟ විධිමත් ගිවිසුම් අත්සන් කළ යුතු වුවත්, රු.මිලියන 2.6 ක හා රු.මිලියන 6.3 ක වටිනාකමින් යුත් වායුසමීකරණ යන්ත්‍ර මිල දී ගැනීමේ දී විධිමත් පරිදි ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

## 3.10 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වු පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ශ්‍රී ලංකා නාවික හමුදාවට පතොරන් ගැබි බහාලුම් 5000 ක් මිලදී ගැනීම සඳහා තෝරාගත් සැපයුම්කරුගේ මිලගණන්වල වලංගු කාලය තුළ දී ඇණවුම් ඉදිරිපත් කිරිමට අපොහොසත් වීම හේතු කොටගෙන නැවත මිල ගණන් කැඳවා එම භාණ්ඩ මිලදී ගැනීමට සිදුවී තිබුණි. එපරිදි නැවත මිල ගණන් කැඳවා මිලදී ගැනීමේ දී වලංගු කාලය තුළ පැවති මිලට වඩා වැඩි මිලක් ගෙවීමට සිදුවීම හේතුකොටගෙන ඒකාබද්ධ අරමුදලින් රු.3,550,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා නාවික හමුදාවේ ජොෂ්ඨතා ලේඛනයේ පිටපත් 750 ක් මුද්‍රණය කිරිමේදී ඒකකයක් රු.390 බැගින් මුද්‍රණය කිරිමට තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබිය දී ඊට පටහැනිව නැවත මිල ගණන් කැඳවා මිල ගණන් ඉදිරිපත් කර තිබුණු එම ආයතනයෙන්ම ඒකකයක් රු.475 බැගින් මුද්‍රණය කිරිම හේතුකොට ගෙන රු.63,750 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) කුලී පදනම මත වාහන ලබාගැනීමේදී අවම මිල ගණන ඉදිරිපත් කළ ආයතනයෙන් දිනකට රු.7,800 ක් බැගින් මුළු අවශ්‍යතාවය වු වාහන 33 ම කුලී පදනම මත ලබා නොගෙන වාහන 8 ක් දිනකට රු.12,500 බැගින් ඊළඟ අවම මිල ඉදිරිපත් කළ ආයතනයෙන් ලබා ගෙන තිබුණි.ඒ හේතුවෙන් රු.164,500 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා නාවික හමුදාවට අවශ්‍ය ඉන්ධන මෙට්‍රික් ටොන් 41 ක් මිල දී ගැනීමට රු.6,328,852 ක මුදලක් විදේශ තෙල් සංස්ථාවට ගෙවා තිබුණ ද එම සංස්ථාව

විසින් සපයා තිබුණු සත්‍ය තෙල් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 39.771 ක් විය. එබැවින් වැඩිපුර ගෙවන ලද රු.189,712 ක මුදල ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා නාවික හමුදාවට නැව් සමාගමකින් ඩීසල් මෙට්‍රික් ටොන් 27.31 ක් මිල දී ගැනීම සඳහා රු.3,722,504 ක් ගෙවා තිබුණද, එම සමාගම සැපයූ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 26.843 ක් විය. එබැවින් රු.63,655 ක මුදලක් සැපයුම්කරුට වැඩියෙන් ගෙවා තිබුණ ද එම වැඩිපුර ගෙවන ලද මුදල ආපසු අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුකොටගෙන ඒකාබද්ධ අරමුදලට රු.63,582 ක පාඩුවක් සිදුවී තිබුණි.

## 3.11 අනාර්ථික ගනුදෙනු

නියැදි පරීක්ෂාවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) විදුලි බිල්පත්වලට නියමිත දිනයේදී මුදල් නොගෙවීම හේතුකොට ගෙන ලංකා විදුලිබල මණ්ඩලය වෙත සමාලෝචිත වර්ෂයේදී රු.3,486,592 ක් පොළී වශයෙන් ගෙවා තිබුණි.

(ආ) 2012 වර්ෂයේ දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා ස්කැප්පොල්ඩින් (Scaffolding) ඒකක 250 ක අවශ්‍යතාවයක් ඉටු කරගැනීම සඳහා ඒකක 1000 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.2,792,975 ක් ගෙවා තිබුණි. ඒ අනුව අවශ්‍යතාවය ඉක්මවා ඒකක 750 ක් මිල දී ගැනීම නිසා රු.2,094,731 ක නිෂ්කාර්ය වියදමක් කර තිබුණි.

## 3.12 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව භාණ්ඩ ලැබීමට පෙර සමාලෝචිත වර්ෂය තුළදී සැපයුම්කරුවන්ට රු.367,486,911 ක් ගෙවා තිබුණි. මෙවැනි ගෙවීම් තවදුරටත් නොකළ යුතු බව 2011 ජුනි 9 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී නියෝග කර තිබුණ ද 2013 නොවැම්බර් 30 දින වන විටත් ශ්‍රී ලංකා නාවික හමුදාව එම ක්‍රමයෙන් බැහැර වී නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන සැපයුම්කරුගේ නමට ලියන ලද රු.3,792,206 ක වටිනාකමකින් යුත් පූර්ව ගෙවීම් ප්‍රේෂණපත් (චෙක්පත්) 7 ක් 2013 පෙබරවාරි 14 දින වන විටද පසු ටෙන්ඩර් අංශයේ (SO/PT) රඳවාගෙන තිබුණි.

(ඇ) ක්‍රීඩා උපකරණ වර්ග 8 කට අදාලව ඒකක 103 ක් සපයා ගැනීමට 2012 මාර්තු 26 දින සැපයුම්කරුට ඇණවුම් ඉදිරිපත් කර තිබුණත් 2013 පෙබරවාරි 7 දින වන විටත් සැපයුම සිදුකර නොතිබුණි.

(ඈ) සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන්වල වලංගු කාලය තුළ ඇණවුම් ඉදිරිපත් කිරීමට නොහැකි වීම හේතුකොටගෙන රු.123,581 ක වටිනාකමකින් යුත් මයික්‍රොවේව් අවන් 12 ක් මිල දී ගැනීමට ශ්‍රී ලංකා නාවික හමුදාවට නොහැකි වී තිබුණි.

(ඉ) සැපයුම්කරුවන් විසින් නාවික හමුදාවට සපයනු ලබන භාණ්ඩවල වටිනාකමට වඩා රු.8,352,000 ක මුදලක් සැපයුම්කරුවන්ට ගෙවා තිබුණු අතර අතිරික්තව ගෙවා තිබුණු මුදල දින 2 සිට දින 360 ක් දක්වා වු කාලයක් සැපයුම්කරු වෙත රඳවාගෙන පසුව නැවතත් නාවික හමුදාවට පියවා තිබුණි. ඒ අනුව රජයේ මුදල් අයථා පරිදි පරිහරණය කිරීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව සැපයුම්කරුවන්ට අවස්ථාව ලබාදී තිබුණි.

(ඊ) භාණ්ඩ සැපයීමට පෙර සැපයුම්කරුවන්ට මුදල් ගෙවා තිබුණු අවස්ථාවන්වල සැපයුම්කරුවන් භාණ්ඩ සැපයීම ප්‍රතික්ෂේප කර තිබුණු අතර එපරිදි ගෙවා තිබුණු රු.9,813,686 ක් වු මුදල ආපසු අයකර ගැනීම සඳහා අදාල සැපයුම්කරුට එරෙහිව නෛතික ක්‍රියා මාර්ග ගැනීමට ශ්‍රී ලංකා නාවික හමුදාවට සිදු වී තිබුණි.

(උ) සැපයුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන්වල වලංගු කාලය තුළ ඇණවුම ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා නාවික හමුදාව අපොහොසත් වීම හේතුකොටගෙන කමීව වෝටර් ජෙට් (KAMEWA water Jet) සඳහා අමතර කොටස් 2 ක් සහ ඉලෙක්ට්‍රොනික් පවර් සප්ලයි (Electronic Power Supply) ඒකකයක් විදේශ රටකින් මිලට ගැනීමේදී රු.226,679 ක මුල්‍ය පාඩුවක් සිදු වී තිබුණි.

## 4. ශීර්ෂය 224 - ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### 4.1 විගණන විෂය පථය

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ඔක්තෝබර් 22 දින ගුවන් හමුදාපති වෙත නිකුත් කරන ලදී . ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ , අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 4.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 4.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඊ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 4.4 සිට 4.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

(i) ගුවන් හමුදාව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| බැරකම් ලේඛනය | මු දල් රෙගුලාසි 211 |

(ii) සමාලෝචිත වර්ෂයේදී ගුවන් හමුදාව වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 04 කට පිළිතුරු ලබා නොදුන් අතර 2012 වර්ෂයට අදාලව විගණන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට හා ඒ ඒ විෂයයන් පිළිබඳව බලතල පවරා තිබූ පාර්ශවයන් හඳුනා ගැනීමේ අරමුණින් ගුවන් හමුදාපති වෙත යොමු කරන ලද තොරතුරු කැඳවීම් ලිපි 29 කින් ඉල්ලා තිබූ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් එම විෂයයන්ට අදාලව විගණන කටයුතු සිදුකළ නොහැකි වූ අතර විධිමත් ලෙස ලේඛන හා පොත්පත් නඩත්තු කරනු ලබන්නේද යන්න තහවුරු කරගත නොහැකි විය.

(ආ) අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයක් සඳහා 2012 වර්ෂයේදී රු.140,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර එයින් සමාලෝචිත වර්ෂයේදී රු.25,954,293 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.114,045,707 ක් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 81.46 ක් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 07 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ලබාගෙන තිබූ රු.155,000,000 ක ප්‍රතිපාදනවලින් වර්ෂය තුළදී රු.65,453,566 ක් උපයෝජනය කර තිබුණි. සළසා තිබුණු රු.89,546,434 ක් වූ ප්‍රතිපාදන ඉතිරිව තිබුණි. එම ඉතිරි ප්‍රතිපාදන තුළ අවස්ථා 03 කදී පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් යටතේ ලබාගත් ප්‍රතිපාදනවලින් රු.40,000,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි.

(iii) ගුවන් හමුදාව වෙත නිශ්චිත කාර්යයන් ඉටු කිරීම සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දී තිබූ ප්‍රතිපාදනවල වටිනාකම

රු.554,676,404 ක් වූ අතර එයින් රු.452,005,621 ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව රු. 102,670,783 ක් වූ ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. ප්‍රමාණවත් කාලසීමාවක් තුළ ප්‍රතිපාදන ලබා නොදීම හා වෙනත් හේතු මත රු.59,825,000 ක ප්‍රතිපාදන සළසා තිබූ කාර්යයන් 03 ක් සම්පූර්ණයෙන්ම ඉටුකර නොතිබුණි.

(ඇ) අග්‍රිම ගිණුම

2013 අප්‍රේල් 30 දින වන විට ගුවන් හමුදාව විසින් පියවා නොතිබුණු අග්‍රිම ශේෂ එකතුව රු.150,202,634 ක් වී තිබුණි. ඉන් රු.574,452 ක් 2001 වර්ෂයේ සිට පැවත එමින් තිබුණි. තවද අග්‍රිම ශේෂ පියවා නොතිබීමට හේතු වූ කරුණු විසර්ජන ගිණුමේ සඳහන් කර නොතිබුණි.

(ඈ) පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව අංක 6000/0000/00/0011/0585/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2012 දෙසැම්බර් 31 දිනට රු.21,225,820 ක ශේෂයක් පැවති අතර එම ශේෂය 2012 වර්ෂයට අදාල විසර්ජන ගිණුමේ ඇතුළත් කර නොතිබුණි. තවද අංක 6000/0000/00/0015/0105/000 දරන පොදු තැන්පත් ගිණුමට අදාලව භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව ශේෂය රු.63,650,386 ක් වූ අතර එය 2012 විසර්ජන ගිණුමේ රු.63,641,018 ක් වශයෙන් දක්වා තිබුණි.

(iii) 2011 හා 2012 වර්ෂවලදී කන්ටේනර් අත්තිකාරම් වශයෙන් ලබාගෙන තිබූ රු.105,626 ක් ලබාදී තිබූ උපදෙස් අනුව රජයේ ආදායමට බැර නොකර 2013 අප්‍රේල් 30 දින වන විටත් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඉ) ආදායම් ගිණුම

ආදායම් සංකේත 20-03-02-16 දරන ආදායම් ගිණුම සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 දෙසැම්බර් 31 දින වන විට ආදායම් ගිණුම අනුව රු.23,872,454 ක ආදායම්, හිඟ හිට තිබුණු අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණය පහත දැක්වේ.

කාල විශ්ලේෂණය

| වර්ෂ 1 ට අඩු | වර්ෂ 1 ට වැඩි වර්ෂ 3 ට අඩු | වර්ෂ 3 ට වැඩි | 2012 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ආදායම |
|---|---|---|---|
| රු. | රු. | රු. | රු. |
| 9,254,535 | 10,951,531 | 3,666,388 | 23,872,454 |

(ii) ආදායම් ගිණුමේ ඇතුළත් කර තිබූ හිඟ ආදායම තහවුරු කරගත හැකි වන පරිදි තොරතුරු ඇතුළත් කරමින් 2012 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් ප්‍රකාශය සකස් කර නොතිබුණි. එසේම 2011 වර්ෂය සමග සැසඳීමේදී 2012 වර්ෂයේ රැස්කළ ආදායම රු.97,080,703 කින් අඩුවී තිබූණු අතර හිඟ ආදායම 2011 වර්ෂයට සාපේක්ෂව රු.16,919,786 කින් වැඩිවී තිබුණි.

(iii) 2010 වර්ෂයේ සිට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබූ රු.205,790 ක ගුවන් යානා කුලී ආදායම් රජයේ ආදායමට බැර කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ රැස්කරගෙන තිබූ රු.175,573,860 ක ගුවන් යානා කුලී ආදායමින් රු.10,697,417 ක් ගුවන් හමුදාවේ අභ්‍යන්තර අරමුදලකට බැර කර තිබුණි.

(iv) ගුවන් යානා මෙහෙයුම් කටයුතු සිදු කරමින් ගුවන් හමුදාව යටතේ තිබෙන පෞද්ගලික සමාගමක් විසින් කුලී ආදායම් රැස්කර තිබුණි. එකී සමාගමේ මෙහෙයුම් කටයුතුවලට අදාල විස්තර හා ආදායම් රැස්කිරීමට අදාල ලදුපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව රැස්කරගත් සියළු ආදායම්, ආදායම් ගිණුමට බැර කර තිබේද යන්න පරීක්ෂා කළ නොහැකි විය.

(iv) 2012 ජූනි 30 දිනට හා 2012 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද හිඟ ආදායම් වාර්තාවල 2011 වර්ෂය වෙනුවෙන් හිඟ ආදායම වෙනම දක්වා නොතිබුණු අතර 2012 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් වාර්තාවේ සංඛ්‍යා එදිනට ආදායම් ගිණුමේ දක්වා තිබූ සංඛ්‍යා සමග සැසඳීමට හැකි වන පරිදි හිඟ ආදායම් වාර්තා සකස් කර නොතිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් වාර්තාව අනුව 2011 වර්ෂයට අදාල හිඟ ආදායම රු.3,286,280 ක් වශයෙන් දක්වා තිබුණද 2012 වර්ෂයේ ආදායම් ගිණුමෙහි පසුගිය වර්ෂයට අදාල හිඟ ආදායම රු.11,652,478 ක් ලෙස දක්වා තිබුණි.

(vi) මුදල් රෙගුලාසි 177(4) අනුව 2012 වර්ෂය හා ඊට පෙර වර්ෂවලදී රැස්කළ ගුවන් යානා කුලී සම්බන්ධයෙන් එකතු කළ මුදල් හා ප්‍රේෂණය කළ මුදල්, කුවිතාන්සි අංකවලට යොමුව දක්වමින් වාර්තා සකස්කර මාසිකව ගණන්දීමේ නිලධාරි විසින් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2011 වර්ෂය අග සිවිල් අංශයෙන් අයවිය යුතුව තිබූණු රු.16,087,477 ක ණය මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.17,624,415 දක්වා වැඩිවී තිබුණි.

(ii) විශ්‍රාම යන නිලධාරින් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.4 වගන්තිය අනුව කටයුතු නොකිරීම නිසා සේවා හා සිවිල් අංශයන්ට අදාලව විශ්‍රාමගිය හා මියගිය අයගෙන් පිළිවෙලින් රු.1,061,594 ක් හා රු.3,460,351 ක් ණය අයකර ගැනීමට නොහැකිව තිබුණි. පැරණි ණය ශේෂවලට අදාල සමහර ලිපිගොනු අස්ථාන ගතවී තිබුණි.

(iii) සේවා හා සිවිල් අංශයන්ට අදාලව වර්ෂ 5 ඉක්මවූ ණය ශේෂවල එකතුව පිළිවෙලින් රු.982,852 ක් හා රු.6,298,524 ක් විය. 2012 අප්‍රේල් 17 දින රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව ගුවන් හමුදාව වෙත දැනුවත් කර තිබුණද, 2013 මැයි මස වන විටත් ඒ අනුව කටයුතු කර අදාල ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 4.4.1 වාර්ෂික කාර්යසාධන වාර්තා

සියලුම අමාත්‍යාංශ ලේකම්රුවන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව ගුවන් හමුදාව විසින් පිළියෙල කළ වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2002 වර්ෂයේ සිට පසුගිය වර්ෂ 10 ට

අදාලව කාර්යසාධන වාර්තා සහ සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාව 2013 ඔක්තෝබර් 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

4.5 වත්කම් කළමනාකරණය

(අ) ජංගම නොවන වත්කම් පිළිබඳ සංචලන වාර්තාව පරීක්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2011 දෙසැම්බර් 31 දින දක්වාවූ වත්කම් 2012 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙන ඒමේදී රු.525,233,980 ක වත්කම් හේතු දැක්වීමකින් තොරව අත්හැර තිබූ අතර රු.1,842,392,775 ක වත්කම් එම වාර්තාවේ අලුතින් ඇතුළත් කර තිබුණි.

(ii) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී මිලටගත් ජංගම නොවන වත්කම්වල මුළු අගය එම වාර්තාවේ රු.235,209,385 ක් ලෙස දක්වා තිබුණු අතර විසර්ජන ගිණුමේ DGSA- 4 ආකෘතියෙහි එය රු.1,685,542,569 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු.1,450,333,184 ක වත්කම් ජංගම නොවන වත්කම් පිළිබඳ සංචලන වාර්තාවේ දක්වා නොතිබුණි.

මේ අනුව 2012 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් වටිනාකම රු.70,344,035,950 ක් ලෙස විසර්ජන ගිණුමේ දක්වා තිබුණද, ඉහත අඩුපාඩු මෙන්ම ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු නොකිරීම හා භෞතිකව වත්කම් සත්‍යාපනය නොකිරිම හේතුවෙන් එම වටිනාකම නිරවද්‍ය නොවන බව නිරීක්ෂණය විය.

(ආ) ගුවන් හමුදාව සතු පරිගණක උපාංග හා මෘදුකාංගවලට අදාලව 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව පරිගණක උපාංග හා මෘදුකාංග ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. තවද ගුවන් හමුදාව සතු පරිගණක වෙනුවෙන් විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් පිළිබඳ සංචලන වාර්තාවේ ආරම්භක ශේෂයක් දක්වා නොතිබුණු අතර වර්ෂය තුළ එකතු කිරීම් වශයෙන් රු.1,916,800 ක් ඇතුළත් කර තිබුණි. ඊට අදාල විස්තරාත්මක තොරතුරු ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) බේරුම් නොකළ බැරකම්

ගුවන් හමුදාව විසින් මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. මුදල් රෙගුලාසි 94 ට පටහැනිව සමාලෝචිත වර්ෂය සඳහා වැය විෂයයන්

30 කට සළසා තිබුණු රු.4,426,160,796 ක ප්‍රතිපාදන රු.1,653,295,756 කින් ඉක්මවා එකතුව රු.6,079,456,552 ක උපයෝජනයක් සඳහා බැරකම් වලට එළඹ තිබුණි.

4.6 කාර්යසාධනය

2012 වාර්ෂික ඇස්තමේන්තු , සංයුක්ත සැලැසුම හා ක්‍රියාකාරි සැලැසුම්වලට අනුව ගුවන් හමුදාවේ කාර්යසාධනය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සංයුක්ත සැලැස්මට අනුකූල නොවීම

සංයුක්ත සැලැස්මේ සඳහන් සමාලෝචිත වර්ෂයට අදාල ඉලක්ක සපුරාලීම සඳහා අයවැය ප්‍රතිපාදන සළසා ගත යුතු වන අතර එම අරමුදල් වර්ෂය තුළ උපයෝගි කර ගන්නා ආකාරය හා මූල්‍ය හා භෞතික ඉලක්කවල වගකීම නිශ්චය කොට කාලීනව තථ්‍ය ශේෂයන් සමග සසඳා අවශ්‍ය සංශෝධන සහිතව අවශ්‍ය ඉලක්ක කරා මෙහෙයවීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කළ යුතු වුවද එවැනි පාලනයක් ඇති වන පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම උපයෝගී කරගෙන නොතිබුණි.

4.7 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

ගුවන් හමුදාව විසින් සිදුකර ඇති සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී එසේ අනාවරණය වූ ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) ගොඩනැගිලි හා ඉදිකිරීම්වලට අදාල කොන්ත්‍රාත්තු

(i) එක් එක් ඉදිකිරීම් කටයුත්තට අදාලව වියදම් වෙන වෙනම ගණනය කර ගැනීමටත්, ඒ අනුව අදාල වත්කමේ වටිනාකම ගණනය කර ගැනීමටත් හැකිවන පරිදි ගුවන් හමුදාව විසින් කොන්ත්‍රාත් ලේඛනය නඩත්තු කර නොතිබුණි.

(ii) අභ්‍යන්තර අරමුදල්වලට බැරවන මුදල්ද ගුවන් හමුදාවේ ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් වැයකර තිබූ අතර ඒ පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වාහන භාවිතය

2011 වර්ෂයේදී ගුවන් හමුදාව විසින් මිළදී ගෙන තිබූ මාණ්ඩලික රථ හා කුලී පදනම යටතේ ලබාගත් මාණ්ඩලික රථ 40 ක් කොළඹ අවට ධාවනය කිරීමේදී ඉන්ධන ලීටරයකින් ධාවනය වී තිබූ කිලෝමීටර ගණන 5 සිට 11 දක්වා පරාසයකට ව්‍යාප්ත වී තිබූ බව 2012 ජූනි මාසයට අදාල ධාවන වාර්තා සම්බන්ධයෙන් කරන ලද නියැදි පරීක්ෂාවකදී අනාවරණය විය.

4.8 අවිධිමත් ගනුදෙනු

ගුවන් හමුදාව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කීහිපයක් පහත දැක්වේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

(i) ගුවන් හමුදා නිලධාරින් සඳහා සපත්තු කුට්ටම් 3000 ක් මිලදී ගැනිම සම්බන්ධයෙන් වූ ප්‍රසම්පාදනයේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- ගුවන් හමුදාවේ නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂයේදී විවෘත මිල ගණන් කැඳවා පෞද්ගලික සමාගමකින් එකක් රු.4,575 බැගින් කලු ලෙදර් සපත්තු කුට්ටම් 3000 ක් මිලදී ගැනීමට රු.13,725,000 ක් වැය කර තිබුණි. මේ සඳහා ලංසු කරුවන් පස් දෙනෙකු මිලගණන් ඉදිරිපත් කර තිබුණි. ප්‍රසම්පාදන කොන්දේසි අනුව ලංසු කරුවන් විසින් මිල ගණන් සමඟ සාම්පල් ඉදිරිපත් කළ යුතු වුවද, තෝරාගත් සැපයුම් කරු විසින් ලංසු කැඳවා අවසන් වූ දින සිට දින 08 කට පසුව සාම්පල් ඉදිරිපත් කර තිබුණි.

- එම ප්‍රසම්පාදනය සඳහා පත්කර තිබුණු තාක්ෂණ ඇගයීම් කමිටුවේ සපත්තු පිළිබඳ දැනුම ඇති නිලධාරියෙකු සිටි බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවූ අතර, සැපයුම්කරුද සපත්තු නිෂ්පාදනය පිළිබඳ ප්‍රවීනත්වයක් ඇති සමාගමක් නොවීය. තවද නිලධාරියෙකුට වසර 1 ½ ක කාලපරිච්ඡේදයක් සඳහා සපත්තු කුට්ටමක් ලබාදෙන අතර සපත්තු පිළිබඳ වගකීම් කාලය මාස තුනකට සීමා වී තිබුණි.

- 2011 වර්ෂයේදී වෙනත් දේශීය සපත්තු නිෂ්පාදන සමාගමකින් රු.2,822 බැගින් සපත්තු 2000 ක් මිලට ගෙන එයින් 700 ක් නිලධාරීන් වෙත නිකුත් කර තිබූ අතර එම නිෂ්පාදන වල ගුණත්වය සම්බන්ධයෙන් ලිඛිත පැමිණිලි කිසිවක් නොතිබියදී හා තවදුරටත් සපත්තු කුට්ටම් 1300 කට වැඩි ප්‍රමාණයක් ගබඩාවේ ඉතිරිව තිබියදී රු.4,575 බැගින් වූ සපත්තු කුට්ටම් 3000 ක් මිලට ගෙන තිබුණි.

- 2012 වර්ෂයේ ලංසු කැඳවීමේදීද පෙර වසරේ සැපයුම්කරු ලෙස තෝරාගත් සපත්තු නිෂ්පාදන සමාගම විසින් මිලගණන් ඉදිරිපත් කර තිබූ අතර එම මිලගණන් අතුරින් (රු.2,419 හා රු.2,741) ඉහළම මිල වන එකක් රු.2,741 බැගින් වූ මිලට සපත්තු කුට්ටම් 3000 ක් මිලදී ගනු ලැබුවේනම් ගුවන් හමුදාවට වැය කළ මුදලින් රු.5,502,000 ක් ඉතිරිකර ගත යුතුව තිබුණි.

(ii) කාර්යාලීය අවශ්‍යතාවයන්ට අනුකූල පිරිවිතරයන් හදුනා නොගෙන කටුනායක සැපයුම් හා බෙදාහැරීම් ගබඩාව හරහා ඇදි රහිත පුටු 300 ක් මිලදී ගැනීමට ලංසු කැඳවා තිබූ අතර එම ලංසු අතුරින්, සඳහන් කර තිබූ පිරිවිතරයන්ට අනුකූලව ඉදිරිපත් කර තිබූ අවම මිල වූ රු.4,256 (එකතු කළ අගය මත බදු සහිතව) බැගින් පුටු මිලදී ගැනීම වෙනුවට වැඩිම මිල ඉදිරිපත් කර තිබූ ලංසුකරු වෙතින් එකක් රු.6,468 බැගින් පුටු 300 ක් රු.1,940,400 කට මිලදී ගෙන තිබුණි. ඒ අනුව මුලින් සඳහන් කළ පිරිවිතරයට අනුව ඉදිරිපත් කළ අවම මිල වූ රු.4,256 වෙනුවට වැඩිම මිල වූ රු.6,468 බැගින් පුටු 300 ක් මිලදී ගැනීම නිසා ගුවන් හමුදාවට රු.663,600 ක අලාභයක් සිදුවී තිබුණි.

(iii) බෙල් 212 හෙලිකොප්ටරයේ එන්ජිම අලුත්වැඩියා කිරීම වෙනුවෙන් 2012 ජනවාරි හා පෙබරවාරි මාසවලදී ණයවර ලිපි මගින් විදේශීය සමාගමකට රු.32,610,978 ක් ගෙවා තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- සීමිත ජාත්‍යන්තර ලංසු කැඳවීමේ අවම කාල සීමාව සඳහා දින 42 ක් ලබාදිය යුතු වුවත් මේ සඳහා දින 21 ක් පමණක් ලබා දී තිබුණි. තාක්ෂණ ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව විසින් ගෙන තිබූ තීරණවල අවිධිමත්භාවය නිසාත් ඒවා නිවැරදි කර ගැනීමට කල්

ගතවීම නිසාත් ප්‍රසම්පාදන කමිටුවට තීරණය ගෙන ඇනවුම ප්‍රදානය කිරීම සඳහා මාස 10 කට ආසන්න කාලයක් ගත වී තිබුණි.

- ස්ථිර මිල ප්‍රකාශ කිරීමට පෙර මෙම එන්ජිම පරීක්ෂා කර බැලීම සඳහා බෙල් ගුවන් යානා නිෂ්පාදනය පිළිබඳ වෘත්තීය පලපුරුද්දක් ඇති විදේශීය සමාගමේ නියෝජිතයෙකුගේ සෘජු දායකත්වය ලබාගෙන නොතිබූ අතර විදේශීය සැපයුම්කරුවන්ගේ දේශීය නියෝජිත විසින් නම්කළ ගුවන් හමුදාවේම විශ්‍රාම ගිය නිලධාරීන් විසින් එය පරීක්ෂා කර තිබුණි. එම පරීක්ෂණ වාර්තාවේ පැවති අඩුපාඩුකම් නිසා පළමු එකඟ වූ එක්සත් ජනපද ඩොලර් 155,910 ක මුදල පසුව විදේශීය සමාගම විසින් එක්සත් ජනපද ඩොලර් 278,959 දක්වා වැඩි කර තිබුණි. ඒ අනුව එම අලුත්වැඩියාව වෙනුවෙන් ගුවන් හමුදාවට එක්සත් ජනපද ඩොලර් 123,049 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) අධිකාරි බලය නොමැති වූ ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් අධිකාරී බලය නොමැති ගනුදෙනු නිරීක්ෂණය විය.

(i) පී.වී.ආර්. පදනම යටතේ මිලදී ගැනීම (PVR)

ගුවන් හමුදාව විසින් පී. වී. ආර්. පදනම යටතේ (භාණ්ඩ හා සේවා ලැබීමට පෙර මුදල් ගෙවීම ) භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.238,157,435 ක් වැය කර තිබුණි. මෙම ගෙවීම් ක්‍රමය වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් විශේෂ අනුමැතියක් ලබා ගන්නා බවට ගුවන් හමුදාව විසින් 2010 හා 2011 වර්ෂවලදී එකඟවී තිබුණත්, 2012 වර්ෂයේදීද ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ii) ගුවන් හමුදාව උපයන ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර නොවීම

2011 ජුනි 23 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියෝගයටද , රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ආයතන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත එවා තිබූ 2003 දෙසැම්බර් 09 දිනැති අංක ආ/iv/5/4/11දරන ලිපියටද ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ

2.4 වගන්තියටද අනුකූලතාවය නොදක්වමින් ගුවන් හමුදාව විසින් පහත සඳහන් පරිදි උපයන ආදායම් අභ්‍යන්තර අරමුදල්වලට බැර කර තිබුණි.

- 2012 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කොළඹ කඳවුරේ ගොඩනැගිලි කුලියට දීමෙන් රු.294,000 ක ආදායමක් උපයා තිබුණු අතර එයින් රජයේ ආදායමට රු.19,800 ක් පමණක් බැර කර තිබුණි. ඉතිරිය කොළඹ කඳවුරේ අභ්‍යන්තර අරමුදලක් වූ සේවා ආයතන අරමුදලට බැර කර තිබුණි. තවද, 2011 ජනවාරි සිට දෙසැම්බර් දක්වාද මෙම ගොඩනැගිලි කුලියට දීම මත ලැබූ ආදායමින් රජයේ ආදායමට රු.22,400 ක් බැර කර තිබූ අතර කොළඹ කඳවුරේ සේවා ආයතන අරමුදලට (SIF) බැර කළ ප්‍රමාණය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

- කොළඹ කඳවුරේ ක්‍රීඩා පිටිය කුලියට දීමෙන් 2011 අගෝස්තු සිට 2012 අගෝස්තු දක්වා රු.366,000 ක් උපයා තිබුණු අතර එම සියලු මුදල් ගුවන් හමුදාවේ කොළඹ කඳවුරේ ඇති සේවා ආයතන අරමුදලට (SIF) බැර කර තිබුණි.

- දියතලාව, මීරිගම, කටුකුරුන්ද, අම්පාර, රත්මලාන, චීනවරාය, ඒකල, මොරවැව, වව්නියාව, පාලවිය, කොග්ගල, වීරවිල, සීගිරිය හා අනුරාධපුරය යන ගුවන් හමුදා කඳවුරුවල පිහිටි රජයේ ගොඩනැගිලි කුලියට දීමෙන් 2012 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ අයකර තිබූ ගාස්තුවලින් කොටසක් වූ රු.157,077 ක් රජයේ ආදායමට බැරකර තිබුණු අතර එම කඳවුරුවල තිබෙන අභ්‍යන්තර අරමුදල්වලට උක්ත කාලය තුළ බැර කරන ලද ආදායම් පිළිබඳ විස්තර පරීක්ෂා කිරීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

- ගුවන් හමුදාව මගින් මෙසේ රැස්කරන ආදායම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 174(4) ප්‍රකාරව මාසික වාර්තා සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(iii) අභ්‍යන්තර අරමුදල් පවත්වාගෙන යාම

ගුවන් හමුදාපතිගේ 2011 නොවැම්බර් 30 දිනැති අංක 852a දරන ගුවන් හමුදා නියෝගයේ අංක 05 ඡේදය අනුව, ගුවන් හමුදා මූලස්ථානය, විවිධ කඳවුරු හා ඒකකවල අභ්‍යන්තර අරමුදල් 96 ක් ආරම්භ කර තිබුණි. මෙම අරමුදල්වල මෙහෙයුම් කටයුතු සඳහා ගුවන් හමුදාව සතු භෞතික හා මානව සම්පත් උපයෝගි කරගෙන තිබූ අතර ඊට අදාලව විගණන කටයුතු සඳහා ඉල්ලන ලද තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## 4.9 අනාර්ථික ගනුදෙනු

2012 වර්ෂයේදී නිල් පැහැති තුවා 40,000 ක් මිළදී ගැනීමට අදාලව බාහිර ආයතනයකින් රසායනාගාර පරීක්ෂණයකට භාජනය කිරීමේ ගාස්තු වශයෙන් ආයතන 12 කින් අයකරගෙන තිබූ රු.240,000 ක් පොදු තැන්පත් ගිණුමට බැර කර තිබූ අතර එම මුදල් වැය නොකර 2013 මාර්තු 31 දින වන විටත් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. එහෙත් ආයතන 11 ක් වෙනුවෙන් අදාල රසායනාගාර පරීක්ෂණ ගාස්තු වාර්ෂික ප්‍රතිපාදන මුදලින් වැයකර තිබූ අතර එම පරීක්ෂණයේ නිර්දේශ කර තිබූ ආයතන සැලකිල්ලට නොගෙන වෙනත් ආයතනයකින් රු.15,680,000 කට නිල්පැහැති තුවා මිලට ගෙන තිබුණි.

## 4.10 කළමනාකරණ දුර්වලතා

### විසඳා නොතිබුණු විගණන ඡේද

විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු පහත සඳහන් විගණන ඡේද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින්ද පරීක්ෂාකර නියෝග නිකුත් කර තිබුණත් 2013 නොවැම්බර් 30 දින වන විටත් එම නියෝගයන් අනුව කටයුතු කර නොතිබුණි.

| | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පැවති දිනය | නියෝග අංකය | විගණන ඡේදය |
|---|---|---|---|
| (i) | 2011 ජුනි 23 | 10 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ පවතින පැරණි හිඟහිටි ණය ශේෂ නිරවුල් කිරීමට පියවර ගැනීම. |
| (ii) | 2011 ජුනි 23 | 18( II) | ක්‍රීඩා පිට්ටනිය කුලියට දී ලබන ආදායම් හා අනෙකුත් රැස්කිරීම් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2011 ජූනි 23 | 16 | විසර්ජන ගිණුමේ දැක්වෙන වටිනාකම් තහවුරු කරගත හැකි වන පරිදි ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කිරීම |

## 5. ශීර්ෂය - 225 පොලිස් දෙපාර්තමේන්තුව

### 5.1 විගණන විෂය පථය

පොලිස් දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජූනි 05 දින පොලිස්පතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 5.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම.

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**5.3 විගණන නිරීක්ෂණය**

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව පොලිස් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 5.4 සිට 5.14 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) **අයවැය විචලනය**

වැය විෂයයන් 06 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.197,178,699 ක්වූ අතර එය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5 ත් සියයට 44 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) **පොදු තැන්පත් ගිණුම**

(i) වර්ෂ 02 ක් ඉක්මවූ රු.14,719,138 ක් වූ තැන්පතු 301 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) 2011 අංක 69 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනතේ 06 (2) හා (3) උප වගන්ති අනුව එකතු කළ අගය මත බදු අයකර මාසික පදනමක් මත ඊළඟ මාසය 20 දිනයට පෙරද, රඳවා ගැනීමේ බදු කාර්තුව අවසන් වී ඊළඟ මස 15 දිනට පෙර ද හා මුද්දර බදු විධිවිධානවල දක්වා ඇති පරිදි අයකළ කාර්තුවට පසු ඊළඟ මස 15 දිනට පෙර ද , දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කළ යුතු වුවද, රඳවාගැනීමේ බදු, එකතු කළ අගය මත බදු හා මුද්දර බදු එකතුව රු.1,537,662 ක් නියමිත කාලය තුළ දී දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(iii) ගොඩනැගිලි අංශයේ රු.37,703 ක් වූ තැන්පතු 12 ක් සම්බන්ධයෙන් තැන්පත් කළ කාරණය පිළිබඳ තොරතුරු පොදු තැන්පත් ගිණුමේ ඇතුළත් කර නොතිබුණි.

(ඇ) **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) හිඟහිටි ණය ශේෂය තුළ මියගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන් ගෙන් අයවිය යුතු එකතුව රු.40,600,688 ක ණය ශේෂයන් ද ඇතුළත්ව තිබුණි. විශ්‍රාම ගිය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප ගෙවනු ලබන අවස්ථාවේ දී සහ මියගිය නිලධාරීන්ගේ වැන්දඹු අනත්දරු අරමුදලින් ප්‍රතිලාභ ගෙවනු ලබන අවස්ථාවේ දී අයවිය යුතු ණය ශේෂයන් ආයතන සංග්‍රහයේ **XXIV** වැනි පරිච්ඡේදයේ 4.2.3, 4.2.4 සහ 4.2.5 වගන්ති ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවද පොලිස් දෙපාර්තමේන්තුව ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) වැඩ තහනම් කළ හා සේවය හැරගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂවල වටිනාකම රු.100,742,122 ක් වී තිබුණි. මෙම නිලධාරීන්ට ණය ලබාදීමේ දී එළැඹ තිබුණු ගිවිසුම අනුව ඇප තබා ඇත්නම් එම ඇපකරුවන්ගෙන් හෝ ගිවිසුමට අනුව වෙනත් පාර්ශවයන්ගෙන් හෝ අදාල ණය ශේෂවල වටිනාකම ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවත්, පොලිස් දෙපාර්තමේන්තුව එසේ කටයුතු කර නොතිබුණි. එම ණය ශේෂයෙන් රු.5,850,896 ක් දැනටමත් අයකර ගෙන ඇති අතර ඉතිරිය අයකර ගැනීමට ඒකකභාර නිලධාරීන් දැනුවත් කර ඇති බව පොලිස්පතිවරයා මා වෙත දන්වා තිබුණි.

(iii) සැසඳුම් ප්‍රකාශයේ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු වෙනත් ණය ශේෂ වශයෙන් දක්වා තිබුණු මඩකලපුව කොට්ඨාශයේ අතුරුදහන්වූ, මියගිය සහ විශ්‍රාම ගිය පොලිස් නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.890,700 ක් හා ත්‍රිකුණාමලය කොට්ඨාශයේ ආපදා ණය සම්බන්ධයෙන් සිදුවී තිබුණු රු.1,275,000 ක වංචාව සම්බන්ධයෙන් එම මුදල් අයකර ගැනීමට හෝ ලියාහැරීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iv) දෙපාර්තමේන්තුවෙන් වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවලට මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.7,946,057 ක මුදල අයකර ගැනීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුව ක්‍රියාකර නොතිබුණි. මේ සම්බන්ධයෙන් 2009 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(v) රජයේ නිලධාරින්ට ණය හා අත්තිකාරම් පාලන ගිණුම අනුව රු.2,774,362,109 ක් වූ ණය ශේෂය කේවල වර්ගීකරණ සාරාංශයේ එකතුව වූ රු.2,696,758,365 සමඟ සැසඳීමේ දී රු.77,603,744 ක වෙනසක් අනාවරණය විය. කොට්ඨාශ කාර්යාලවල පාලන ගිණුම්වල ගැලපූ එකතුවත් කේවළ ශේෂ වර්ගීකරණ සාරාංශයේ සම්පූර්ණ එකතුවත් අතර වෙනස වූ රු.15,594,265 ක වෙනස ගැලපීමෙන් පසුව ද රු.62,009,479 ක් වූ වෙනසක් ඇති වී තිබුණු අතර 2013 ජුනි 14 දින වන විටත් වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 5.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේ දී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 5.4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම.

ඉහත 5.4.1 හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 5.4.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

ඉහත 5.4.1 හි සඳහන් රාජ්‍ය මුදල් අධ්යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2013 මැයි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 5.4.4 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 5.5 වත්කම් කළමනාකරණය

වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු භාණ්ඩ වර්ග රාශියක ඌණතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757(2) හි සඳහන් විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ වර්ග රාශියක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 770(2) සහ 771(3) ප්‍රකාරව ක්‍රියාකර නොතිබුණි.

### 5.6 අනුකූල නොවීම්

නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|
| | රු. | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ <u>ආයතන සංග්‍රහය</u> | | |
| XII පරිච්ඡේදයේ 16.5 වගන්තිය | 489,720 | විදේශගත වූ පොලිස් නිලධාරියෙකු විසින් අත්සන් කරන ලද ගිවිසුම කඩකිරීම නිසා අයකර ගත යුතු මූල්‍යමය දණ්ඩනය වූ රු.489,720 ක් 2013 අප්‍රේල් 30 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ <u>මුදල් රෙගුලාසි සංග්‍රහය</u> මුදල් රෙගුලාසි 880 | කොටහේන ප්‍රධාන පොලිස් ගබඩා භාරකරුගෙන් ඇප ලබා ගැනීමට ක්‍රියාකර නොතිබුණි. |

## 5.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

**ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම්**

පොලිස් දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණත් එම ව්‍යාපෘති නිමනොකර අත්හැර තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු දිනය | 2012 දෙසැම්බර් 31 දින වන විට වියදම | අත්හැර දැමීමට හේතු |
|---|---|---|---|---|
| | රු. මිලියන | | රු. | |
| ඉංගිරිය පොලිස් අභ්‍යාස ආයතනය ඉදිකිරීම. | 21.9 | 2007 සැප්.20 | 8,393,410 | ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග නිසිලෙස ක්‍රියාත්මක නොකිරීම. (අවසන් කළ යුතුව තිබුණේ 2008 අගෝස්තු 10 දින දීය) |

මේ සඳහා වැයකළ මුදල අපතේ නොයැවූ අතර ඉදිකළ ගොඩනැගිල්ල ඉංගිරිය පොලිස් ස්ථානය සඳහා ලබාගැනීමට දැනටමත් කටයුතු කර ඇති බව පොලිස්පතිවරයා දන්වා තිබුණි.

## 5.8 කාර්යසාධනය

ශ්‍රී ලංකාව තුළ 2010, 2011 සහ 2012 වර්ෂවලට අදාලව වාර්තා වූ ග්‍රහන අපරාධ (ශාරීරික වැරදි සහ දේපළ වැරදි) පිළිබඳ සමාලෝචනයක් පහත දැක්වේ.

**2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ග්‍රහන අපරාධ වාර්තා වූ ගණන හා ප්‍රතිශතය**

| | ග්‍රහන අපරාධ | 2010 | | | 2011 | | | 2012 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ ගණන | විසඳු ගණන | විසඳු ගණනේ ප්‍රතිශතය | වාර්තා වූ ගණන | විසඳු ගණන | විසඳු ගණනේ ප්‍රතිශතය | වාර්තා වූ ගණන | විසඳු ගණන | විසඳු ගණනේ ප්‍රතිශතය |
| | **ශාරීරික වැරදි** | | | | | | | | | |
| 01 | අපහරණය/ පැහැරගෙන යාම් | 897 | 217 | 24.9 | 1012 | 202 | 19.96 | 1240 | 266 | 21.45 |
| 02 | බරපතල තුවාල සිදුකිරීම් | 1410 | 647 | 45.89 | 1719 | 728 | 42.35 | 1727 | 718 | 41.57 |
| 03 | පිහි ආදියෙන් තුවාල සිදුකිරීම් | 2939 | 1095 | 37.26 | 2942 | 1033 | 35.11 | 2870 | 1060 | 36.93 |
| 04 | මනුෂ්‍ය ඝාතනය / සිය පණ හානිකර ගැනිමට අනුබල දීම | 745 | 249 | 33.42 | 707 | 231 | 32.67 | 646 | 183 | 28.33 |
| 05 | මනුෂ්‍ය ඝාතනයට තැත්කිරීම | 308 | 95 | 30.84 | 229 | 56 | 24.45 | 227 | 62 | 27.31 |
| 06 | ස්ත්‍රී දූෂණය/ බාල ගැහැණු ළමුන් සමග කාමුක සංසර්ගය | 1854 | 167 | 9.01 | 1870 | 235 | 12.57 | 2212 | 224 | 10.13 |
| 07 | අස්වාභාවික වැරදි / පුරුෂයන් අතර තදබල අශෝබන ක්‍රියා | 519 | 47 | 9.06 | 517 | 37 | 7.16 | 576 | 55 | 9.55 |
| 08 | ළමුන්ට කෲර ලෙස සැලකීම හා ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම | 334 | 39 | 11.68 | 376 | 40 | 10.64 | 398 | 36 | 9.05 |
| 09 | කාමුක සංසර්ගය සඳහා ස්ත්‍රියක/ ගැහැණු ළමයෙකු සැපයීම හා වෙළෙඳාම | 47 | 12 | 25.53 | 56 | 05 | 8.93 | 31 | 03 | 9.68 |
| 10 | දරුණු ආයුධ පනත යටතට ගැනෙන වැරදි | 277 | 29 | 10.47 | 147 | 29 | 19.73 | 162 | 16 | 9.88 |
| | **එකතුව** | **9330** | **2597** | **27.83** | **9575** | **2596** | **27.11** | **10089** | **2623** | **26.00** |
| | **දේපළ වැරදි** | | | | | | | | | |
| 01 | ගිනි තැබීම | 691 | 177 | 25.62 | 576 | 141 | 24.48 | 585 | 149 | 25.47 |
| 02 | රු.5,000 ට වැඩි අලාභ ඇතිවන පරිදි සිදුකරන අනර්ථ | 1323 | 428 | 32.35 | 1069 | 304 | 28.44 | 1096 | 313 | 28.56 |
| 03 | ගෙවල් බිඳීම හා සොරකම | 18665 | 3224 | 17.27 | 17192 | 2954 | 17.18 | 16763 | 2948 | 17.59 |
| 04 | කැරලි කෝලාහල | 14 | 05 | 35.71 | 25 | 10 | 40.00 | 18 | 06 | 33.33 |
| 05 | මංකොල්ලකෑම | 6521 | 1422 | 21.81 | 6304 | 1588 | 25.19 | 6552 | 1447 | 22.08 |
| 06 | බලෙන් පැහැර ගැනීම | 103 | 48 | 46.60 | 125 | 47 | 37.60 | 138 | 47 | 34.06 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 07 | රැවටීම්/වංචා සහගත ලෙස අත්සන් ගැනීම් රු.100,000 ට වැඩි වටිනාකම සම්බන්ධයෙන් සාපරාධී විශ්වාසය කඩකිරීම | 7238 | 2777 | 38.37 | 6365 | 1865 | 29.30 | 8820 | 2378 | 26.96 |
| 08 | වැව්ලි ද්‍රව්‍ය ඇතුළු රු.5,000 ට වැඩි දේපළ සොරකම හා කුමන වටිනාකමක් හෝ වන පරිදි පා පැදි හා ගව සොරකම | 12680 | 3753 | 29.60 | 11962 | 3649 | 30.50 | 11704 | 3773 | 32.24 |
| 09 | ව්‍යාජ මුදල් නෝට්ටු මුද්‍රණය කිරීම | 38 | 05 | 13.16 | 47 | 04 | 8.51 | 45 | 07 | 15.56 |
| 10 | රාජ්‍ය විරෝධී අන්දමින් සිදුකෙරෙන වැරදි | 15 | 02 | 13.33 | 08 | 0 | 0.00 | 05 | 01 | 20.00 |
| 11 | ස්වයංක්‍රිය හෝ රිපීටර් පතරොම් තුවක්කු ලඟතබා ගැනීම | 80 | 09 | 11.25 | 52 | 07 | 13.46 | 32 | 08 | 25.00 |
| 12 | හෙරොයින්, කොකේන්, මෝෆන් කිසියම්ම ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම, වෙළෙඳාම් කිරීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම හෝ හෙරොයින් ග්‍රෑම් 02 ක් හෝ ඊට වැඩි ඔපියම් ග්‍රෑම් 500 ක් හෝ ඊට වැඩි ගංජා කි.ග්‍රෑම් 05 ක් හෝ ඊට වැඩි හා හෂීස් කි.ග්‍රෑම් 01 ක ප්‍රමාණයක් වූ අන්තරාදායක මත්ද්‍රව්‍ය ලගතබා ගැනීම. | 862 | 132 | 15.31 | 1067 | 259 | 24.47 | 1315 | 448 | 34.07 |
| | **එකතුව** | 48230 | 11982 | 24.84 | 44792 | 10828 | 24.17 | 47073 | 11525 | 24.48 |
| | **මුළු එකතුව** | 57560 | 14579 | 25.33 | 54367 | 13424 | 24.69 | 57162 | 14148 | 24.75 |

ඉහත දැක්වෙන කරුණු අනුව ග්‍රහන අපරාධ විසඳීම මන්දගාමී ස්වරූපයක් ගෙන තිබුණි.

## 5.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

**ගැලපුම් කළ යුතු ශේෂ**

පොලිස් දෙපාර්තමේන්තුව විසින් 2012 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු කොට්ඨාශ 48 ක බැංකු සැසඳුම් ප්‍රකාශනවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| ගැලපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | | |
|---|---|---|---|---|
| | මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු | වර්ෂ 01 ට වැඩි වර්ෂ 03 ට අඩු | වර්ෂ 03 වැඩි | එකතුව |
| | රු. | රු. | රු. | රු. |
| උපලබ්ධි නොවූ තැන්පතු | 19,886 | - | 15,000 | 34,886 |
| නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් | 165,228 | 263,745 | | 428,973 |
| හඳුනානොගත් හර | 8,108 | - | - | 8,108 |
| හඳුනානොගත් බැර | 93,324 | - | - | 93,324 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වලංගු කාලය ඉක්මවූ නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ රු.428,973 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඩී) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) උපලබ්ධි නොවූ තැන්පත් තුළ මාස 06 ඉක්මවූ රු.34,886 ක් වූ තැන්පතු උපලබ්ධි නොවීම සම්බන්ධයෙන් පසු විපරම් කිරීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) හඳුනානොගත් රු.8,108 ක් වූ හර කිරීම් හා හඳුනානොගත් රු.93,324 ක් වූ බැර හඳුනාගෙන ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

**5.10 අවිධිමත් ගනුදෙනු**

විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවිධිමත් ස්වරූපයේ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

**(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැරවීම**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 3.4 මාර්ගෝපදේශය අනුව දිගු කාලයක් තුළ ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණු වායු සමීකරණ යන්ත්‍ර 16 ක් (මින් වායුසමීකරණ යන්ත්‍ර 10 ක් 2011 වර්ෂයේ ඉල්ලුම් කර තිබුණි.) තරඟකාරී මිල ගණන් යටතේ මිලදී නොගෙන වෙළෙඳ පොළ මිල සැදැහුම් ක්‍රමය භාවිතා කරමින් රු.2,183,151 කට මිලදී ගෙන තිබුණි.

**(ආ) පොදු කොන්ත්‍රාත්**

**(i) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතට අනුව කොන්ත්‍රාත්කරුවන් කටයුතු කර නොතිබීම**

උක්ත පනතේ 6(1) (අ) උප වගන්තියට අනුව කොන්ත්‍රාත් ගිවිසුමේ පිරිවැය රුපියල් පනස් ලක්ෂයක් ඉක්මන අවස්ථාවක සෑම කොන්ත්‍රාත්කරුවෙකුම හෝ එම කොන්ත්‍රාත්කරු වෙනුවෙන් අනුයෝජිතයකු, උප අනුයෝජිතයකු, නියෝජිතයකු නැතහොත් නාමිකයෙකු ලෙස ක්‍රියාකරන සෑම තැනැත්තෙක්ම කොන්ත්‍රාත්තුව පිරිනැමූ දින සිට දින 60 ක් තුළ කොන්ත්‍රාත් ගිවිසුම ලියාපදිංචි කළ යුතු වුවත් පොදු කොන්ත්‍රාත්තු 47 ක් පිරිනමන ලද සමාගම් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**(ii) පොදු කොන්ත්‍රාත් පනතට අනුව ලියාපදිංචි වූ බවට වලංගු ලියාපදිංචි කිරීමේ සහතිකයක් නොමැතිව රු.1,257,818,195 ක් වූ කොන්ත්‍රාත් 47 කට අදාල කොන්ත්‍රාත්කරුවන් සමඟ ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු නිලධාරීන් කටයුතු කර තිබීම.**

පොදු කොන්ත්‍රාත් පනතේ 12 වන වගන්තියට අනුව පනතේ 08 වන වගන්තියේ සඳහන් තැනැත්තන් විසින්, මේ පනත යටතේ නිකුත් කරන ලද වලංගු ලියාපදිංචි කිරීමේ සහතිකයක් පළමුවෙන් තමා වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස,

පොදු මණ්ඩලයක ඒ මණ්ඩලයේ කාර්මික කමිටුව ප්‍රසම්පාදන කමිටුව හෝ ඇගයීම් කමිටුවක යම් සාමාජිකයකු විසින් හෝ එහි යම් නිලධාරියෙකු නැතහොත් සේවා නියුක්තිකයෙකු විසින් නැතහොත් යම් රාජ්‍ය නිලධාරියෙකු හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා හැර, යම් පොදු කොන්ත්‍රාත් ගිවිසුමකින් උද්ගතවන්නාවූ හෝ එවැනි කොන්ත්‍රාත් ගිවිසුමකට අදාල වන්නාවූ යම් කාරණයක් සම්බන්ධයෙන් 08 වන වගන්තියේ සඳහන් යම් තැනැත්තෙකු සමග කිසිම කටයුත්තක් කරනු නොලැබිය යුතු වුවද, වලංගු ලියාපදිංචි කිරීමේ සහතිකයක් නොමැති කොන්ත්‍රාත්කරුවන් සමග ප්‍රසම්පාදන හා ඇගයීම් කමිටුවල නිලධාරීන් කටයුතු කර තිබුණි. ඉහත පරිදි කටයුතු කිරීම මත පනතේ 12 වගන්තියට අනුව එකී නිලධාරීන් විසින් දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර තිබුණි.

**5.11 අභ්‍යන්තර පාලනය**

-----------------------

මහල් 04 කින් යුත් ප්‍රධාන පොලිස්පති ගබඩාවේ විශාල වටිනාකමකින් යුත් ගබඩා අයිතම රාශියක් පවතින අතර තනි ගබඩා භාරකරුවකු වෙත වගකීම් සියල්ල භාර දී තිබුණි. මේ හේතුවෙන් වැරදි සහ වංචා ඇතිවීමට ඇති හැකියාව බැහැර කළ නොහැකිවූ අතර භාණ්ඩ භාරගැනීම , නිකුත් කිරීම සහ ලේඛන ගත කිරිම එක් නිලධාරියෙකු මත සිදුවන බැවින් ප්‍රධාන පොලිස්පති ගබඩාවේ අභ්‍යන්තර පාලනය දුර්වල මට්ටමක පැවතුණි.

**5.12 කළමනාකරණ දුර්වලතා**

---------------------------

2012 සැප්තැම්බර් 03 දින 146 වැනි පොලිස් දිනයේ දී රු.3,360,000 ක් වැය කරමින් නිල වශයෙන් ආරම්භ කළ පොලිස්පතිතුමා වෙත පැමිණිල්ලක් හෝ තොරතුරක් සැපයීමේ කෙටි පණිවුඩ සේවාව 2013 අප්‍රේල් 30 දින වන විටත් ක්‍රියාත්මක මට්ටමේ නොතිබුණි. මෙම සේවාව ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගැනීම කෙරෙහි ඉහළ කළමනාකාරීත්වයේ විශේෂ අවධානය යොමු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

“ පොලිස්පතිට කියන්න විද්‍යුත් තැපැල් මාර්ගික පැමිණිලි මෙහෙයුම් මැදිරිය ස්ථාපිත කර දැනට එම කාර්යන් සඳහා භාවිතා කරනු ලබයි” යන්න පොලිස්පතිවරයා මේ සම්බන්ධයෙන් විගණනයට දන්වා තිබුණි.

## 5.13 පාඩු හා හානි

විසර්ජන ගිණුමේ දක්වා තිබුණු කපාහැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ වාර්තාව අනුව රු.25,000 කට වැඩි රු.416,363,050 ක පාඩු සිද්ධීන් 855 ක් පැවති අතර එය පහත පරිදි විශ්ලේෂණය කළ හැක.

කාල විශ්ලේෂණය

| රු.25,000 ට වැඩි | අවු.05 – 10 අතර | අවු.10 ට වැඩි | එකතුව |
|---|---|---|---|
| පාඩු සිද්ධි සංඛ්‍යාව | 672 | 183 | 855 |
| වටිනාකම (රු.) | 396,721,558 | 19,641,492 | 416,363,050 |

මෙම පාඩු හා හානි කපාහැරීමට හෝ වෙනත් ක්‍රියාමාර්ග ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

## 5.14 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක සංඛ්‍යාව | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 736 | 515 | 221 | - |
| (ii) | තෘතියික මට්ටම | 3,209 | 3,667 | - | 458 |
| (iii) | ද්විතිය මට්ටම | 82,685 | 72,071 | 10,614 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 2,992 | 2,870 | 122 | - |
| (v) | වෙනත් | 673 | 673 | - | - |
| | එකතුව | 90,295 | 79,796 | 10,957 | 458 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 10,957 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) බඳවාගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබාගැනීමට අපොහොසත් වී තිබුණි.

6 ශීර්ෂය 226 - ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

6.1 විගණන විෂය පථය

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම්, ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගතවූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජුනි 21 දින පාලක ජනරාල් වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

6.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

6.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණය

සහ පහත 6.4 සිට 6.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 22601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට ණය වාරික අය නොවී පැවති ශේෂවල එකතුව රු.2,308,474 ක්වූ අතර, ඉන් රු.345,410 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

6.4 අනුකූල නොවීම්

නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම.

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථාවක් විග්‍රහ කර පහත දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | රු. | |
| මුදල් රෙගුලාසි 94 | 3,177,779 | සමාලෝචිත වර්ෂය අවසාන වන විට වැය විෂයයන් 5කට අදාලව ඉතිරිවීම් රු.1,314,367 ක් වී තිබුණත් එම ඉතිරිය රු.3,177,779 කින් ඉක්මවා රු.4,492,146 ක බැරකම්වලට එළඹ තිබුණි. |

6.5 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2012 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් වීසා රහිතව රැඳී සිටින්නන් 856 දෙනෙකු අත් අඩංගුවට ගෙන තිබුණත්, 2012 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වීසා රහිතව

රැඳී සිටි විදේශිකයින් සංඛ්‍යාව 11,444 ක් බව දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියේ දත්තවල පෙන්නුම් කර තිබුණි.

(ආ) සංචරණය සඳහා විද්‍යුත් අනුමැතිය ක්‍රියාත්මක කිරීමේ පද්ධතිය සඳහා වූ ගිවිසුම අනුව වෙබ් පිටුව නිර්මාණකරු වෙබ් පිටු තුළ ප්‍රචාරණය කිරීම් නොකළ යුතු බව සඳහන් වුවද, එක් සමාගමක් එම වෙබ් පිටු තුළ ඔවුන්ගේ නිල ලාංඡනය ප්‍රදර්ශණය කර තිබුණු අතර ඊට අදාල ගාස්තුවක් අයකර එම නිල ලාංඡනය ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබාදීම පිළිබඳව සළකා බලන බව පාලක ජනරාල් විසින් දන්වා තිබුණි. ලෝකය පුරා ශ්‍රී ලංකාවේ සංචරණය සඳහා අපේක්ෂාවෙන් සිටින විදේශිකයින් මෙම වෙබ් පිටුව පරිහරනය කිරීම හේතුවෙන් අදාල ආයතනය මිල කළ නොහැකි ප්‍රචාරණයක් මේ තුළින් ලබා ගන්නා බව අවධාරණය කරන අතර, 2012 ජනවාරි 01 දින සිට 2013 ජුනි 19 දින දක්වා විවිධ රටවල පුද්ගලයින් 1,835,536 දෙනෙකු මෙම පද්ධතිය තුළින් වීසා අයදුම් කර තිබුණු බව දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියේ දත්තවල පෙන්නුම් කර තිබුණි.

(ඇ) ද්විත්ව පුරවැසි සහතික නිකුත් කිරීම තාවකාලිකව නවතා තිබුණි. 2012 මැයි මස අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නව ආකාරයකට ද්විත්ව පුරවැසිභාවය පිරිනැමීමට යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීමට රජය යෝජනා කර තිබුණු නමුත් එම යෝජනා ක්‍රමය 2014 අගෝස්තු 19 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. කෙසේ වෙතත් 2013 ජනවාරි සිට 2013 ජුනි 19 දින දක්වා ද්විත්ව පුරවැසි සහතික 78 ක් නිකුත් කර තිබුණු අතර ඒ වෙනුවෙන් රු.11,250,000 ක ආදායමක් ලැබී තිබුණු බව දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියේ දත්තවල පෙන්නුම් කර තිබුණි.

(ඈ) ශ්‍රී ලංකාවට පැමිණෙන නාවිකයින් විගමනය නොවනු ලබන අවස්ථාවක් උද්ගත වුවහොත් ඔවුන් ශ්‍රී ලංකාවෙන් ඉවත් කිරීමේ කටයුතු සඳහා නාවික ඒජන්තවරු සහ මහ බැංකුවේ අධිපති වෙනුවෙන් ආගමන හා විගමන පනතේ ප්‍රතිපාදනවලට යටත්ව දෙපාර්තමේන්තුව වෙනුවෙන් බලයලත් නිලධාරීන් විසින් බැඳුම්කරයකට අත්සන් කරනු ලබයි. එම බැඳුම්කර වටිනාකම් වසර 20 කට වඩා පැරණි වකවානුවක සිට පැවැත එන ඒවා වූ බැවින් කාලීනව වෙනස්කම් කර නොතිබුණු හෙයින් එය ප්‍රායෝගික නොවන බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| රට | වටිනාකම |
|---|---|
| | රු. |
| මාලදිවයින | 1,000 |
| පකිස්ථානය/බංග්ලාදේශය | 2,000 |
| යුරෝපය/මැද පෙරදිග | 4,650 |
| සමාජවාදී රටවල් | 5,925 |
| ඇමරිකානු/දකුණු අප්‍රිකානු රටවල් | 6,975 |

විදේශික නාවිකයා ශ්‍රී ලංකාවෙන් ඉවත් කිරීම සඳහා වන සියළුම වියදම් අදාල නැව් සමාගම මගින් ලබාගැනීමට හැකිවනසේ නව බැඳුම්කර ලියවිලි සකස් කළයුතු අතර ගිවිසුම් නීතියේ සඳහන් නියමයන් අනුගමනය කරමින් නෛතික ගිවිසුමකට එළඹීමට කටයුතු කරන ලෙස නියෝජ්‍ය පාලක (නීති) වෙත උපදෙස් දෙනු ලැබූ බව පාලක ජනරාල් විසින් දන්වා තිබුණි.

(ඉ) බත්තරමුල්ලේ ආපදා ප්‍රතිකර්මීය උපස්ථක මධ්‍යස්ථානය පවත්වාගෙන යාම වෙනුවෙන් මැලේසියාවේ ආයතනයක් සමග 2007 අගෝස්තු සිට වසර 5 ක් සඳහා ඇති කරගෙන තිබුණු ගිවිසුම මත මසකට රු.1,600,000 කුලියක් ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව 2007 අගෝස්තු සිට 2012 දෙසැම්බර් දක්වා ගෙවා තිබුණු මුළු මුදල රු.94,560,000 ක් වූ අතර, 2013 ජනවාරි 31 දිනෙන් ගිවිසුම් කාලය අවසන් වී තිබුණි.

## 6.6 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 60 | 48 | 12 |
| (ii) | තෘතීයික මට්ටම | 391 | 310 | 81 |
| (iii) | ද්විතීයික මට්ටම | 408 | 335 | 73 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 137 | 115 | 22 |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 02 | 02 | - |
| | එකතුව | 998 | 810 | 188 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 188 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

7. ශීර්ෂය 227 - පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

7.1 විගණන විෂය පථය

පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන , පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජුනි 20 දින කොමසාරිස් ජනරාල් වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

7.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

7.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ)

දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 7.4 සිට 7.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් දෙකක් සඳහා සළසා තිබුණු රු.550,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් හයක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ත් සියයට 80 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි. මෙයට පිළිතුරු වශයෙන් කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම හේතුවෙන් සංග්‍රහ සහ නිළ ඇඳුම්ද, සිවිල් ආරක්ෂක සේවයේ නිලධාරීන්ගේ සේවය ලැබීම හේතුවෙන් අතිකාල හා නිවාඩු දින වැටුප්ද, ප්‍රතිපාදන අවුරා තැබීම හේතුවෙන් යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ හා පුහුණු කිරීමේ හැකියා වර්ධනයද යන වැය විෂයයන්ගේ ප්‍රතිපාදන ඉතිරිවී තිබුණු බව කොමසාරිස් ජනරාල් විසින් දන්වා තිබුණි.

(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබද සැසදුම් ප්‍රකාශය

විෂය අංක 22701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබද 2012 දෙසැම්බර් 31 දිනට සැසදුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිග හිට තිබුණු ශේෂවල එකතුව රු.2,257,592 ක් විය. ඉන් රු.792,750 ක් 2013 ජුලි 31 දින වන විට අයවී ඇති බවද, රු.1,069,668 ක් මාසික වාරික වශයෙන් අයකරමින් පවතින බවද, දැනට අයවීමට ඇති ශේෂය රු.395,174 ක් පමණක් බවත් මෙයට පිළිතුරු වශයෙන් කොමසාරිස් ජනරාල් විසින් දන්වා තිබුණි.

## 7.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 7.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සහා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2012 මාර්තු 10 දිනැති

අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු අතර, 2012 සිට 2014 දක්වා කාල පරිච්ඡේදය සඳහා සකස් කරන ලද සංයුක්ත සැලැස්ම 2013 ජූලි 09 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

7.4.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

7.5 අනුකූල නොවීම්

නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| මුදල් රෙගුලාසි 94 | 2,197,995 | වැය විෂයයන් 05 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු ඉතිරිය රු.67,059 ක් වුවත් එම ඉතිරිය රු.2,197,995 කින් ඉක්මවා එකතුව රු.2,265,054 ක බැරකම් වලට එළඹ තිබුණි. |

(ආ) භාණ්ඩාගාර වක්‍රලේඛ

| | |
|---|---|
| 2002නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන වක්‍රලේඛය | පරිගණක හා ඒ හා සම්බන්ධ උපාංග වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

7.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘතිය ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.
විද්‍යුත් හැඳුනුම්පත් ව්‍යාපෘතිය සඳහා 2007 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා රු.මිලියන 728.3 ක ප්‍රතිපාදන සළසා තිබුණ අතර එම කාල පරිච්ඡේදය තුළ රු.මිලියන 314.2 ක් උපයෝජනය කර තිබුණු නමුත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක මට්ටමට සාර්ථක කරගත නොහැකි විය. නැවතත් 2011 අගෝස්තු 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විද්‍යුත් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම හා විද්‍යුත් දත්ත ගබඩාව ස්ථාපනය කිරීමට තීරණය කර තිබුණි. මේ සඳහා රු.මිලියන 1,200 ක ප්‍රතිපාදන 2012 වර්ෂය වෙනුවෙන් සළසා තිබුණද 2012 වර්ෂයේ ඒ සඳහා රු.මිලියන 44.9 ක් පමණක් උපයෝජනය කර තිබුණි. විද්‍යුත් දත්ත ගබඩාව ස්ථාපනය කිරීම සඳහා 2013 ජුනි මස ලංසු (Bid) කැඳවා තිබුණු අතර, දත්ත රැස්කිරීමේ කටයුතු 2013 වර්ෂය තුළ අවසන් කිරීමට සැලැසුම් කර ඇති බව කොමසාරිස් ජනරාල් විසින් විගණනය වෙත දන්වන ලදී.

7.7 කාර්යසාධනය

අරමුණුවලට පටහැනි ක්‍රියාකාරකම්

දෙපාර්තමේන්තුව සිය අරමුණුවලට අදාල කාර්යන් වලින් බැහැරව ක්‍රියා කළ අවස්ථා නිරීක්ෂණය වූ අතර, නියැදි පරීක්ෂණවලදී එසේ අනාවරණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

පුද්ගලයාගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ඇති ප්‍රධානතම ලියවිල්ල වන ජාතික හැඳුනුම්පත් සකස් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී අයදුම්පත් 900,751 ක් ලැබී තිබුණු අතර, හැඳුනුම්පත් 781,922 ක් නිකුත්කර තිබුණි. පැරණි මෙන්ම මෑත කාලයේදී නිකුත් කළ හැඳුනුම්පත් අංකවලද නිරවද්‍යතාවය තහවුරුකර ගැනීමට, දිනකට විශාල අයදුම්කරුවන් සංඛ්‍යාවක් පැමිණෙන අතර, 2012 වර්ෂයේදී අංක නිකුත් කිරීමේ වැරදිවලට අදාල ඉල්ලුම්පත්වලින් සියයට 1 ක පමණ නියැදි පරීක්ෂාවකදී එවැනි අවස්ථා 52 ක් නිරීක්ෂණය විය. නිකුත් කරනු ලබන හැඳුනුම්පත් අංක පිළිබඳව නිවැරදි පසු විපරමක් හෝ පරීක්ෂාවක් සිදු නොවීම මෙලෙස අංක වැරදීමට හේතුවක් වී තිබුණු බව නිරීක්ෂණය වූ අතර එම සිදුවීම්වල ස්වභාවය පහත දැක්වේ.

(අ) උපන් දිනයට නොගැලපෙන අංක නිකුත් කිරීම.

(ආ) ස්ත්‍රී හෝ පුරුෂ ලෙස හඳුනාගත හැකි ආකාරයට හැඳුනුම්පත් අංක නිකුත්කළ යුතු වුවත් එසේ කර නොතිබීම.

(ඇ) උපන් වසර, වසර කිහිපයකින් අඩු හෝ වැඩි ලෙස සටහන් කර තිබීම.

(ඈ) එකම අංකය දෙදෙනෙකු වෙත නිකුත් කර තිබීම.

(ඉ) දෝෂ සහිත ලෙස අංක නිකුත් කර තිබීම.

(ඊ) වලංගු නොවන අංක නිකුත් කර තිබීම.

පරිගණක පද්ධතියකට ඇතුළත් කිරීම මගින් වැරදි අංක සහිත හැඳුනුම්පත් නිකුත්වීම වැලැක්වීමට අවශ්‍ය පියවර මේ වනවිට ගෙන ඇති බවත්, විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය යටතේ ඉදිරියේදී හැඳුනුම්පත් නිකුත් කිරීම ආරම්භ කළ පසු මෙම දෝෂ සම්පූර්ණයෙන්ම මග හැරෙන බවත් කොමසාරිස් ජනරාල් විසින් දන්වන ලදී.

7.8 මානව සම්පත් කළමනාකරණය

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 19 | 14 | 05 |
| (ii) තෘතීයික මට්ටම | 04 | 01 | 03 |
| (iii) ද්විතීයික මට්ටම | 368 | 253 | 115 |
| (iv) ප්‍රාථමික මට්ටම | 139 | 132 | 07 |
| එකතුව | 530 | 400 | 130 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 130 ක් පිරවීමට අපොහොසත් වී තිබුණි. පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර තිබුණු බව කොමසාරිස් ජනරාල් විසින් විගණනය වෙත දක්වා තිබුණි.

## 8 ශීර්ෂය 291 - වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### 8.1 විගණන විෂය පථය

වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 සැප්තැම්බර් 13 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

8.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

8.3 විගණන නිරීක්ෂණය

---

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (උ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 8.4 සිට 8.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) ලේඛන පවත්වා නොතිබීම

---

වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| වැය ලෙජරය | මුදල් රෙගුලාසි 447 | තුලනය කර විධිමත්ව පවත්වා නොතිබුණි. |
| පාඩු හා හානි ලේඛන | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| තැන්පත් ලේඛන | මුදල් රෙගුලාසි 414 | යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි. |

(ආ) අයවැය විචලනය

-------------------

ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂයය යටතේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් රු.715,000,000 ක ප්‍රතිපාදන සළසාගෙන තිබුණද, එම ප්‍රතිපාදනයෙන් රු.75,400,000 ක් මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.639,600,000 ක ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂයට අදාලව රු.514,901,641 ක් ද ඉකුත් වර්ෂවල බැරකම් පියවීම සඳහා රු.20,713,970 ක් ද උපයෝජනය කිරිමෙන් පසුව රු.103,984,389 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. ඒ අනුව එම වැය විෂයේ රු.158,670,319 ක ප්‍රතිපාදන මාරු කිරීම් හා ඉතිරිවීම් තිබුණු හෙයින් ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂයය වෙනුවෙන් අයවැය ඇස්තමේන්තු මගින් අධි ප්‍රතිපාදන සළසා ගෙන තිබුණි.

(ඇ) වියදම් පිළිබඳ පාලනය

--------------------------

මුදල් රෙගුලාසි 94 ට පටහැනිව වැය විෂයයන් 08 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් වර්ෂය අවසානයේ ඉතිරිය රු.159,933 කින් ඉක්මවා එකතුව රු.1,835,753 ක බැරකම්වලට එළඹ තිබුණි.

(ඈ) අග්‍රිම ගිණුම

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 දෙසැම්බර් 31 දිනට වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තු අග්‍රිම ගිණුමේ රු.378,713 ක් වූ අග්‍රිම හර ශේෂය 2013 ජූලි 31 දින වන විටද පියවා නොතිබුණි.

(ii) ගාල්ල බටහිර වෙරළ තීරයේ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවට අවිධිමත් ලෙස ලබා දී තිබුණු රු.3,000,000 ක අත්තිකාරම් මුදලින් තවදුරටත් පියවා නොතිබුණු ශේෂය රු.378,713 ක් වී තිබුණි.

(ඉ) පොදු තැන්පත් ගිණුම

-------------------------

2012 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.33,765,148 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 565 (5) පරිදි එක් එක් මාසය සඳහා පොදු 71 ආකෘතිය අනුව, මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් පිළියෙල කර ඊළඟ මාසය අවසාන වීමට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි.

(ii) වර්ෂ දෙකක් ඉක්මවා තිබුණු එකතුව රු.10,658,843 ක් වූ හිමිකම් නොපෑ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඊ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සේවය අතහැර ගිය සේවකයන් 03 දෙනෙකුගේ හා ව්‍යාපෘතියකට අනුයුක්ත කළ සේවකයකුගේ හිඟ ණය ශේෂය 2012 දෙසැම්බර් 31 දිනට එකතුව රු.519,859 ක් විය. එම ශේෂ වර්ෂ 03 සිට වර්ෂ 10 දක්වා කාලයක සිට පැවැත එන අතර 2013 ජූලි 31 දින වන විටත් එම ශේෂ අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ii) 1994 අගෝස්තු 10 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පරිදි දෙපාර්තමේන්තු පාලන ගිණුම් ශේෂය හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශ ශේෂය අතර වූ රු.1,902 ක වෙනස සැසඳුම් කර නිරවුල් කර නොතිබුණු අතර වෙනසට හේතු පැහැදිලි කර නොතිබුණි.

## 8.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 8.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 8.4.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන කටයුතු සිදු කර නොතිබුණි.

8.4.3 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම.

සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කර නොතිබුණි.

8.5 වත්කම් කළමනාකරණය

(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවැති කාලය |
|---|---|---|
| (i) වාහන | 02 | වර්ෂ 04 කට වැඩි කාලයක් |
| (ii) යන්ත්‍ර සූත්‍ර | 02 | වර්ෂ 04 කට වැඩි කාලයක් |
| (iii)පාවිච්චියෙන් ඉවත් කළ වාහන | 06 | වර්ෂ 05 කට වැඩි කාලයක් |
| (iv)පාවිච්චියෙන් ඉවත් කළ යන්ත්‍ර සූත්‍ර | 01 | වර්ෂ 05 කට වැඩි කාලයක් |

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

මුදල් රෙගුලාසි 756 හා 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2013 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව විගණනයට 2013 ජුනි 13 දින ඉදිරිපත් කර තිබුණි.

(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් රු.711,000 ක් වටිනා වාහනයක් අවිධිමත් ලෙස හිටපු අමාත්‍යවරයකුගේ සම්බන්ධීකරණ ලේකම්වරයකු වෙත මුදාහැර තිබුණි .

(ඈ) බේරුම් නොකළ බැරකම්

වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල එකතුව රු.28,330,617 ක් වූ අතර එම බැරකම් වර්ෂ 01 ට අඩු කාලයක සිට පැවත එමින් තිබුණි.

8.6 කාර්යසාධනය

2012 වාර්ෂික ඇස්තමේන්තු/ ක්‍රියාකාරී සැලැස්මට අනුව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්

ඇතැම් ප්‍රධාන කාර්යයන් මුළුමනින්ම ඉටු නොකර හෝ ප්‍රමාණවත් ලෙස ඉටු නොකර හෝ තිබුණු අතර එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ .

(i) වෙරළ ආරක්ෂිත ව්‍යූහ නව ඉදිකිරීම්වල තත්ත්වය පහත සටහනේ දැක්වේ.

| ඉදිකිරීම් ව්‍යාපෘතිය | ප්‍රතිපාදනය<br>රු.මිලියන | උපයෝජනය<br>රු.මිලියන | 2012 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම්වල තත්ත්වය |
|---|---|---|---|
| * අම්බලන්ගොඩ- පටබැඳිමුල්ල මීටර් 250 දිග ග්‍රොයිනය | 10.00 | 5.57 | ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණු අතර ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීමට පමණක් සීමා වී තිබුණි. |
| * මාරවිල - දූවවත්ත - මීටර් 200 දිග රිවට්මන්ට් බැම්ම | 6.50 | 5.22 | |
| * තලවිල -මීටර් 60ක් දිග ග්‍රොයිනය | 10.00 | 4.17 | |

| | | | |
|---|---|---|---|
| * උනවටුන - මීටර් 200ක් දිග දියකඩනය | 55.00 | 12.99 | |
| * දික්වැල්ල - ඉකිරිතුඩුව මීටර් 100 දිග දියකඩනය | 10.00 | 2.77 | ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණු අතර ඉදිකිරීම් ද්‍රව්‍ය සුළු ප්‍රමාණයක් පමණක් මිලදී ගෙන තිබුණි. |
| * මාරවිල - තලවිල මීටර් 60ක් දිග දියකඩන 03 | 120.00 | 51.00 | 2012 අගෝස්තු 27 දින වන විට අවසන් කිරීමට ඉලක්ක කර තිබුණද, රු.මිලියන 51 ක ඉදිකිරීම් කළ පසු කොන්ත්‍රාත් සමාගම ඉදිකිරීම් පැහැර හැර තිබුණි. එහෙයින් වැඩ ආරම්භක අවස්ථාවේ ගෙවා තිබූ රු.මිලියන 21.51 ක අත්තිකාරම් මුදලෙන් රු.මිලියන 10.26 ක් තවදුරටත් අය කර ගත යුතුව තිබුණි. |
| * මාරවිල - තලවිල මීටර් 60 ක් දිග දියකඩන 02 | 60.00 | 38.15 | 2011 වර්ෂයේදී ආරම්භ කර තිබුණද, දිය කඩන 01ක පමණක් ඉදි කිරීම් අවසන් කර තිබුණි. එහි පිවිසුම් බැම්ම ඉවත් කර වැඩ සම්පූර්ණ කර නොතිබුණි. |

(ii) වෙරළ වැලි පෝෂණය කිරීමේ ව්‍යාපෘතිවල තත්ත්වය පහත දැක්වේ.

* මාරවිල - තලවිල වෙරළ වැලි පෝෂණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 350 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි. එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 311.98 ක් උපයෝජනය කර එම විශේෂ ව්‍යාපෘති යටතේ උස්වැටකෙයියාව වෙරළ වැලි පෝෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි.

* වැල්ලවත්ත වෙරළ තීරය ගොඩනැගීම වෙනුවෙන් වූ වැලි පෝෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 7 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එය ක්‍රියාත්මක කර නොතිබුණි. එම

ප්‍රතිපාදනවලින් රු.මිලියන 1.08 ක් උපයෝජනය කර දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන වියදම් වෙනුවෙන් වැය කර තිබුණි.

(iii) වෙරළ උද්‍යාන ඉදිකිරීම හා සක්මන් මාර්ග ඉදිකිරීම්වල තත්ත්වය පහත දැක්වේ.

- * මාතර වෙරළ උද්‍යානය ඉදිකිරීම 2011 වර්ෂයේදී ආරම්භ කර තිබුණද , එහි පළමු හා දෙවන අදියර ඉදිකිරීම් සඳහා සමාලෝචිත වර්ෂයේදී තවත් රු.මිලියන 16 ක ප්‍රතිපාදන සළසා තිබුණි. එම ප්‍රතිපාදනයෙන් රු.මිලියන 13 ක් පළමු අදියරේ ඉදිකිරීම් සඳහා උපයෝජනය කර තිබුණි.

- * ප්‍රතිපාදනය රු.මිලියන 13 ක් වූ වැල්ලමඩම වෙරළ උද්‍යානය ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම සඳහා රු.මිලියන 13 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, එම කාර්ය ඉටුකර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම ප්‍රතිපාදනයෙන් රු.මිලියන 4.25 ක් වැයකර කාණු පද්ධතිය හා පැති බැම් ඉදිකිරීම පමණක් ඉටුකර තිබුණි.

- * ගාල්ල බටහිර වෙරළ තීරය මීටර් 450 ක සක්මන් මග ඉදි කිරීම, මීටර් 100 ක වෙරළ උද්‍යානය අලංකරණය කිරීම හා විදුලි ආලෝකකරණය කිරීම 2011 වර්ෂයේදී ආරම්භ කර තිබුණද, එය සම්පූර්ණ කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 10 ක ප්‍රතිපාදන සළසා තිබුණත් 2012 දෙසැම්බර් 31 දින වන විටත් එම කාර්යයන් සම්පූර්ණ කර නොතිබුණි .

(iv) වෙරළබඩ කලාප හා වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පහත දැක්වේ.

- * 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනතේ 5(9) වගන්තිය පරිදි 2006 වර්ෂයේදී ආරම්භ කර ක්‍රියාත්මක කළ වෙරළබඩ කලාප වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම වර්ෂ 05 ක් ගතවීමට ප්‍රථම ප්‍රතිශෝධනය කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31

---

දින වන විට ඒ සඳහා වසර 07 ක් ගතවී තිබුණද, සමාලෝචනය සඳහා පියවර ගෙන නොතිබුණි.

* අනවසර ඉදිකිරීම් පරීක්ෂාවන් ඉටු කර අනවසර ඉදිකිරීම් කඩා දැමීමේ නියෝග 155 ක් සමාලෝචිත වර්ෂයේදී නිකුත් කර තිබුණද, එයින් අනවසර ඉදිකිරීම් 24 ක් හෙවත් සියයට 15 ක් පමණක් කඩා ඉවත් කර තිබුණි. ඉකුත් වර්ෂයේදී නියෝග නිකුත් කළ අනවසර ඉදිකිරීම් 388 ක් අතුරින් 275 ක් 2012 දෙසැම්බර් 31 දින වන විටත් කඩා ඉවත් කර නොතිබුණි.

* මුළු දිවයිනම සඳහා වෙරළ පිවිසුම් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට රු.මිලියන 2 ක් ප්‍රතිපාදන සළසා සැලැසුම් කර තිබුණද, ගාල්ල, පුත්තලම වෙරළ කලාප පිවිසුම් මාර්ග හඳුනාගැනීමේ සමීක්ෂණ කටයුතු පමණක් ඉටුකර තිබුණි. කෙසේ නමුත් එම ප්‍රතිපාදන අනවසර ඉදිකිරීම් පරීක්ෂාවන් වෙනුවෙන් උපයෝජනය කර තිබුණි.

* සමස්ථ දිවයිනේම වෙරළබඩ කලාපය ආශ්‍රිතව හරිත වන වගාව සිදු කිරීමට සැලැසුම් කර රු.මිලියන 2 ක ප්‍රතිපාදන සළසා තිබුණි. එම ප්‍රතිපාදනයෙන් රු. 753,870 ක් වැය කර වැල්ලවත්ත, මොරටුව හා උස්වැටකෙයියාව වෙරළබඩ ප්‍රදේශවල කිලෝමීටර් 06 ක හරිත වන වගා ස්ථාපිත කර ඇති බව දන්වා තිබුණද, රෝපණය කළ පැල එම වෙරළබඩ කලාපවල දක්නට නොලැබුණි. මේ සඳහා ප්‍රතිපාදනය කළ රු.1,256,130 ක් අනවසර ඉදිකිරීම් පරීක්ෂාවන් වෙනුවෙන් උපයෝජනය කර තිබුණි.

(v) ජාතික වෙරළ තීරය කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා වූ පරීක්ෂණ හා නිරීක්ෂණ කටයුතු ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අතර දත්ත එක් රැස් කිරීමේ කටයුතු සම්පූර්ණ කර නොතිබුණි .

8.7 බැංකු ගිණුම්

--------------

අය කළ රජයේ ගාස්තු රු. 30,000 ක් වෙනුවෙන් ලබාගෙන තිබුණු පුද්ගලික චෙක්පත අගරු වී තිබුණද, එම මුදල 2013 මැයි 10 දින වන විටත් අය කර ගෙන නොතිබුණි. මුදල් රෙගුලාසි

169(2) විධිවිධානවලට පටහැනිව දෙපාර්තමේන්තුව විසින් පෞද්ගලික ආයතනයකින් ලද චෙක්පත උපලබ්ධි වීමට පෙර සේවා සැපයීමට කටයුතු කර තිබීම මීට හේතු වී තිබුණි.

8.8 පාඩු හා හානි

විසර්ජන ගිණුමේ සීජීඑස්ජ් 8 යටතේ වූ පාඩු පිළිබඳ ප්‍රකාශයෙහි හානි හා පාඩු කිසිවක් නොමැති බවට වාර්තා කර තිබුණු නමුත් 2009 වර්ෂයේදී හා 2012 වර්ෂයේදී මෝටර් වාහන අනතුරු 02 කින් රු.600,000 ක් හා 2011 වර්ෂයේදී එක්ස්කැවේටර් යන්ත්‍ර අනතුරකින් රු.442,358 ක් වශයෙන් එකතුව රු.1,042,358 ක ඇස්තමේන්තුගත හානි හා පාඩු සිදු වී තිබුණි. මුදල් රෙගුලාසි 104 විධිවිධාන පරිදි එම හානි හා පාඩු වාර්තා කර, මුදල් රෙගුලාසි 109 විධිවිධාන පරිදි කටයුතු කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ පොතෙන් අස් කිරීමට පියවර ගෙන නොතිබුණි.

8.9 මානව සම්පත් කළමනාකරණය

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 37 | 17 | 20 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 01 | 02 |
| (iii) | ද්විතීක මට්ටම | 334 | 248 | 86 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 176 | 79 | 97 |
| | එකතුව | 550 | 345 | 205 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ 205 ක් වූ පුරප්පාඩු පිරවීම සඳහා මුදල් රෙගුලාසි 71 ප්‍රකාර අනුමැතිය ලබා දී තිබුණත් එම පුරප්පාඩු පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

8.10 අභ්‍යන්තර පාලනය

අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන කටයුතු සිදු කර නොතිබුණි.

## 9. ශීර්ෂය 320 - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

### 9.1 විගණන විෂය පථය

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 අගෝස්තු 15 දින අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ , අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 9.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 9.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ආ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 9.4 සිට 9.7 දක්වා වූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

(i) දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව පවත්වා නොතිබුණු බව නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. |
| පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන්වන ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

(ii) දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් තුනකට සහ ඉකුත් වර්ෂවල දී නිකුත් කළ විගණන විමසුම් එකකට 2013 මාර්තු 31 දින වන විට ද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. 7,012,992 ක් විය.

**(ආ) පොදු තැන්පත් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ 02 ක් ඉක්මවූ රු.8,736,188 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) 2012 වර්ෂයේ දී උපයන ලද රු.38,423,787 ක ආදායම් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 9.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 9.4.1 සංයුක්ත සැලැස්ම

සියලුම අමාත්‍යාංශ ලේකම්රුවන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේ දී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 9.4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

ඉහත 9.4.1 හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන්වූ ක්‍රියාකාරී සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 9.4.3 වාර්ෂික කාර්යසාධන වාර්තා

ඉහත 9.4.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2013 ජුනි 20 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 9.4.4 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**9.5 වත්කම් කළමනාකරණය**

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2013 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එම වාර්තාව 2013 මැයි 31 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

(i) දෙපාර්තමේන්තුව විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.113,771,016 කට බැඳී තිබුණු අතර එම ප්‍රමාණය වර්ෂ 01 කට අඩු කාල පරිච්ඡේදයක් තුළ පැවතුණි.

(ii) මුදල් රෙගුලාසි 94 ට පටහැනිව වැය විෂයයන් 19 කට අදාලව ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු.102,819,127 ක බැරකම්වලට එළඹ තිබුණි.

**9.6 අනුකූල නොවීම්**

**නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි යනාදීයට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මුදල් රෙගුලාසි 115 (4) | 387,502 | පූර්ව මුදල් වර්ෂයට කලින් වූ මුදල් වර්ෂයට අදාල සෑම හිමිකම්පෑමක් සඳහාම ගෙවීම් කිරීමට මත්තෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අනුමැතිය ලබාගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 855 | 675,985 | රජයේ දෙපාර්තමේන්තුවකට අවශ්‍ය පුවත්පත් මිල දී ගැනීම සඳහා අවශ්‍යතාවයන් පිළිබඳව ලේකම්වරයාට ඉදිරිපත් කර පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි . |

## 9.7 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

දෙපාර්තමේන්තුව විසින් මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ජංගම ගිණුමක් හා ඉතිරිකිරීමේ ගිණුම් 02 ක් පවත්වා තිබුණි.

## 10. ශීර්ෂය 325 - ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව

### 10.1 විගණන විෂය පථය

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 අගෝස්තු 08 දින අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන

ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ , අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**10.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ සහ ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම , පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ සහ ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**10.3 විගණන නිරීක්ෂණය**

---

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හි දැක්වෙන පොදු නිරීක්ෂණය සහ පහත 10.4 සිට 10.8 දක්වා වූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණි.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන ලේඛනය භාණ්ඩාගාර චක්‍රලේඛය |

**10.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**10.4.1 සංයුක්ත සැලැස්ම**

වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂයේ සිට ඉදිරි වසර 5 සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණ ද එම සංයුක්ත සැලැස්මේ අදාල අරමුණු ඉටු කර ගත යුතු කාලවකවානු, වගකිවයුතු නිලධාරින් පිළිබඳ විස්තර, දෙපාර්තමේන්තුව සතු ශක්තීන්, දුර්වලතා, අවස්ථාවන් හා තර්ජන යනාදී කරුණු ඇතුළත් කර නොතිබුණි.

**10.4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

ඉහත 10.4.1 ජේදයේ සඳහන් පරිදි පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2012 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද එම ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු සහ ඒවා ඉටු කර ගත යුතු කාල වකවානු නිසියාකාරව දක්වා නොතිබුණි.

**10.4.3 වාර්ෂික කාර්යසාධන වාර්තා**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2013 ජුනි 10 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**10.4.4 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරිම**

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/09/01 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර කාර්තුවකට එක බැගින් රැස්වීම් පැවැත්විය යුතු වුවත් 2012 වසර තුළ විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කර නොතිබුණි.

**10.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

2011 නොවැම්බර් 25 දින ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් පෞද්ගලික ආයතනයක් සමඟ ඇතිකර ගත් ගිවිසුමක් අනුව ගිවිසුම්ගත වටිනාකමෙන් සියයට 10 ක් හෙවත් රු.228,500 ක්වූ කාර්යසාධන සුරක්ෂණයක් ලබාගැනීමට එකඟ වී තිබුණත් අදාල සැපයුම්කරු විසින් ලබා දී තිබුණේ රු.100,000 ක් වූ කාර්යසාධන සුරක්ෂණයකි.

**10.6 අවිධිමත් ගනුදෙනු**

**අධිකාරී බලය නොමැති වූ ගනුදෙනු**

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සංදේශ අංක 03/2011 අනුව රාජකාරි සෘජු දුරකථන පහසුකම් සඳහා මාසික ඒකාබද්ධ වියදම් සීමාව යටතේ වෙරළ ආරක්ෂක "රෝහණ " මිරිස්ස පොදු දුරකථනය සඳහා රු.8,000 ක් මාසික ඒකාබද්ධ ගාස්තු ලෙස සීමාකර තිබුණද 2012 පෙබරවාරි මස දුරකථන බිල්පත රු.10,378 ක් වී තිබුණි.

**10.7 පාඩු හා හානි**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට නිල ඇඳුම් මැසීම සඳහා ආයතනයක් තෝරාගැනීමේ දී පළමු ලංසු කැඳවීමේදී ඉදිරිපත් කළ මිල ගණන් ප්‍රතික්ෂේප කර දෙවන අවස්ථාවේ දී ඉදිරිපත් කළ මිල ගණන් පිළිගැනීම නිසා දෙපාර්තමේන්තුවට සිදුවූ අලාභය රු.140,000 ක් විය.

(ආ) ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සඳහා ඇඳ ඇතිරිලි, තුවා, කොට්ට උර ආදිය මිල දී ගැනීමේ දී පළමුවර අවම මිල ගණන් ඉදිරිපත් කළ ආයතනයෙන් සම්පූර්ණ ප්‍රමාණයම මිල දී නොගෙන වාර 7 ක් මිල ගණන් කැඳවා 7 වන අවම මිල ගණන්

ඉදිරිපත් කළ ආයතනයෙන්ම මිල දී ගැනීම හේතු කොටගෙන දෙපාර්තමේන්තුවට සිදුවූ අලාභය රු.78,000 ක් විය.

**10.8 මානව සම්පත් කළමනාකරණය**

ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවයේ නියුතු නිලධාරීන් 42 ක් සහ නැවියන් 743 ක් කාර්ය මණ්ඩලය වශයෙන් දෙපාර්තමේන්තුවේ සේවය කළද දෙපාර්තමේන්තුවට අවශ්‍ය කාර්යය මණ්ඩලය භාණ්ඩාගාරයෙන් අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.